HNB FINANCE
මෙහෙවර
2019 ජූලි - අගෝස්තු කලාපය

HNB ෆිනෑන්ස් "ආසියාවේ සේවය කිරීමට සුදුසු විශිෂ්ටතම සමාගම් 25" අතරට....

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් වන HNB ෆිනෑන්ස් ආසියාවේ සේවය සඳහා සුදුසුම විශිෂ්ටතම ආයතන 25 න් එකක් ලෙස Great Place to Work නම් ආයතනය විසින් මෑතකදී නම් කරන ලදී. එම ආයතනය විසින් කරන ලද ස්වාධීන සමීක්ෂණයකින් පසු මෙම තෝරාගැනීම සිදු කර ඇත.

HNB ෆිනෑන්ස් මෙවැනි පිළිගැනීමක් ලද මෙරට එකම මූල්‍ය ආයතනය වන අතර ආයතනයේ සේවා සංස්කෘතිය බලාත්මක කිරීම, බඳවා ගැනීම් පටිපාටිය, වෙනස්කොට නොසැලකීම, කුසලතා පදනම මත උසස්වීම් ප්‍රදානය යනාදී කරුණු මෙම සම්මානය ලැබීම සඳහා හේතු වී ඇත.

05 පිටුවට

HNB ෆයිනෑන්ස්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන), රුවන් ප්‍රනාන්දු ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ප්‍රියලාල් අරංගල යන මහතුන් Great Place to Work සම්මානය හැටන් නැෂනල් බැංකුවේ සභාපති දිනේශ් වීරක්කොඩි මහතා අතින් ලබා ගනිමින්.

නොකඩවා වැඩකරන්න, සාර්ථකත්වය ඔබ සොයා එනු ඇත.

කේවිඩ්ගේ අප්‍රතිහත උත්සාහයේ සලකුණ

ඔබ ඔබගේ ජීවිතයේ සියළු ඉලක්ක ජයගෙන තිබෙනවා දෝ කොපමණ ඉලක්ක පැරදී තිබේ දෝ පැරදුණු වෙලාවට ඔබ කොතරම් මානසිකව කඩා වැටී ඇත්ද කියා ඔබෙන්ම විමසා බලන්න. එකදිගටම අසාර්ථක වන විට පෙර කර්මය පලදීලා නැතිනම් මහා කාලකන්ණියෙක් හෝ පව්කාරයෙක් ලෙස ඔබව සමාජය මෙන්ම ඔබවම හංවඩු ගසාගත් වාර අනන්තවත් පැවතිය හැක. එනම් මම මහා අසාර්ථක කෙනෙක් කරන කිසි දෙයක් හරි යන්නේ නැහැ. මේ මගේ අවසානය ආදී ලෙස ඔබ ඔබ ගැනම අවතක්සේරු කළ අවස්ථා එමට පැවතිය හැක. එවන් වූ ජීවිතය අගතාගයරම යන හෙක් මුළු ජීවිතයම අසාර්ථක වූ අයෙකුගේ ධෛර්යය, අධිෂ්ඨානය, කැපවීම ගැන ලොවටම තඩ ගා කියූ සුන්දර කථාවක් අපට හමුවෙයි.

ඇමරිකාවේ ඉන්දියානා ප්‍රාන්තයේ ඉතාමත් දුප්පත් පවුලක දරුවන් තිදෙනෙකු සිටියා. මේ දරුවන් තිදෙනාගෙන් වැඩිමහල් දරුවා පුතෙකි. අනිත් දෙදෙනා දුවරු දෙදෙනෙකි. වැඩිමහල් දරුවාගේ නම කේවිඩ් සැන්ඩර්ස් නම් විය. මේ වන විට කේවිඩ්ගේ තාත්තා තැනින් තැන එදා වේල සොයා ගැනීමට කම්කරුවකු ලෙස වැඩකලත් නිශ්චිත ආදායමක් උපයාගත්තේ නැත. ඒ පළාතේ හොට්ලවල්වල කුලී වැඩ කරලයි ඉතා අමාරුවෙන් පවුල තබන්නු කලේ. අම්මා දරුවන් බලා ගෙන ඉතා අසරණ ලෙස ජීවිතය ගත කළ පවුලක් විය. තාත්තට දිනක් ඉතා දරුණු ලෙස උණක් වැදුනු අතර වෙවුල වෙවුලා සිට පසුවදා අවදි වී බලන විට තාත්තා ඉතා අවාසනාවන්ත ලෙස මියගොස් සිටියේය. මෙය මුළු පවුලටම මිරුවා පහරක් විය. මේ වන විට කේවිඩ් යන්නම් අවුරුදු 6 ක කුඩා දරුවෙකි.

මෙතැන් සිට අසරණ වූ පවුල ගොඩගැනීමට අම්මා ලඟ ඇති කම්හලක කුලී වැඩට යාමට තීරණය කළාය. කේවිඩ්ට නංගිලා දෙදෙනා බලාගෙන සිටීමට සිදුවිය. ගෙදර කෑම බීම පිසීමේ සිට ගෙදර සියළු වැඩ කටයුතු බාර ගැනීමට සිදුවූයේ කුඩා කේවිඩ්ටය. කේවිඩ්ට කෑම උයන හැටි අම්මා කියා දුන්නාය. ඒ නිසා කුඩා පුතුට කෑම පිසීමට ද හැකියාව ලැබුනි. මේ අතර ගෙදර දැඩි ආර්ථික ප්‍රශ්න නිසාම මව තව විවාහයක් කර ගත් අතර කේවිඩ්ට බාප්පාගෙන් විවිධ හිංසනයන්ට ලක්වීමට සිදුවිය. එම හිංසනයන් ඉවසීමට බැරිම තැන කුඩා කේවිඩ් ගෙදරින් පැන ගියේය. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 16 කි. නමුත් මේ වයසේ දී රැකියා කිරීම තහනම් නිසා වයස වැඩිකර උප්පැන්න සහතිකයක් සකසා ඇමරිකන් හමුදාවට බැඳුනි. ඔහුගේ බොරු වයස හමුදාවට තනු වීම නිසා එම රැකියාවෙන් ද ඉවත් කරන ලදී. ඉන්පසුව ඔහු තාවකාලික රැකියාවන් කිහිපයකම නිරතවිය. එනම් වරෙක දුම්බෝට්ටුවක හියලු රැකියාවක්, රක්ෂණ නියෝජිතයෙක්, අලෙවි සහකරුවෙක් ආදී වශයෙන් රැකියාවන් සිදු කලත් ඒ හැමිතැනකින්ම ඉවත් වීමට ඔහුට සිදු විය. මෙසේ තම ජීවිතය අසාර්ථක වීම නිසා දැඩි මානසික පීඩාවන්ට පත්වුවද මානසිකව කඩා නොවැටී නැවත වරක් ඉතා අමාරුවෙන් දුම්රිය සේවකයකු ලෙස ටික කාලක් රැකියාවක නිරත වූවේය. මේ කාලයේ අන් රැකියාවන්ට වඩා දුම්රිය රැකියාවේ යම් ස්ථිර බවක් දැනුනු නිසා ඔහු විවාහ ජීවිතයට ද ඇතුලත් වී දරුවන් තිදෙනෙකුගේ පියකු ද විය. නමුත් ඔහුගේ ස්ථාවර බව අස්ථාවර කරමින් නැවත ඔහුගේ අවසානය ඔහුට සරදම් කරන්නට වූයේ එතෙක් කරමින් තුන් රැකියාව අහිමි කරමිනි. මේ නිසා ඔහුට ජීවිතයේ බොහෝ දේ අහිමි විය. එනම් බිරිඳ තම දරුවන්ද සමඟ බිරිඳගේ දෙමාපියන් ප්‍රාන්තට පැමිණි බවත් කේවිඩ් සමග හැමදාම ගැටළු හා ප්‍රශ්න සමඟින් ඇයට ජීවත් වීය නොහැකි බවත් දක්වමින් බිරිඳගේ අයියා ලිපියක් ද එවන ලදී. මේ සිද්ධිය කේවිඩ්ට අතිශය මානසික පීඩනයක් ගෙනදුන්නද, නැවතත් ඔහුගේ උත්සාහය අත්හැරියේ නම් නැත. ඔහු ඔහුගේ ගමන්මග වෙනස්ම පැත්තකට ගෙන යාමට තීරණය කළ අතර ඔහු හීතිය හැදෑරීමට යොමු විය. නමුත් එයද ඉතා කෙටි කලකින් නතර විය. දැන් ඔහුට කිසිවක් නොමැත. බිරිඳ දරුවන් මෙන්ම අනාගතය ශක්තිමත් කර ගැනීමට මාර්ගයක් ද නොමැත. මේ වන විට ඔහුගේ වයස 40 කි. ඔහු ඉතිරි කර ගත් කිසිදු මුදලක් නොතිබූ අතර උදව්කිරීමටත් කිසිවකු නොවිය. මේ වන විට ඔහුට ඉතිරිව තිබුනේ සිතේ සැඟව තිබූ ධෛර්යය පමණි.

ඉන්පසු ඔහු නැවතත් තැනින් තැන කුලී වැඩ කර ජීවිතයේ පළමු වතාවට සුළු මුදලක් එකතු කර ගන්නා ලදී. ඉන් ඉතා කුඩා පිරවුම් හලක් මිලට ගත්තේ ය. එය පිහිටා තිබුනේ ග්‍රෙගොරිඩා ප්‍රාන්තයේ කෙන්ටකි වල කෝබින් නම් ගම්මානයේ ය. මේ ස්ථානයේ නිතර මිහිසුන් ගැවසෙන සමාගමක් විය. ඔහුට තිවසක් නොතිබූ නිසා නැවතී සිටියේ ද පිරවුම් හලේමය. ඔහුට මෙම ස්ථානයේ ම කෑම ගැනීමට ස්ථානයක් නොමැති නිසා කුඩා කැන්ටීමක් ද ඇරඹිය. ඔහු අම්මාගෙන් ඉගෙන ගත් කෑම වර්ගවල රසය අනුව විවිධ කෑම වර්ග සාදා කැන්ටීම පවත්වා ගෙන යන ලදි. අවුරුදු හයේ සිට කෑම සාදා අත්දැකීම් ඇති කේවිඩ්ගේ කෑම වලට කවුරුත් ඉතා කැමති විය. ඉන් වඩාත්ම මිහිසුන් කැමති වූයේ කුකුල් මස් බැදුම්වය. මෙය ක්‍රමයෙන් ඉතා ජනප්‍රිය විය. මේ නිසාම ඔහුගේ ආදායමත් ක්‍රමයෙන් වර්ධනය විය.මෙය ඉතා ජනප්‍රිය වූ ගමන්ම නැවතත් ඔහුගේ ජීවිතයට අවාසනාව පැමිණියේය. එයට හේතුව වූයේ කොරිමින් හරහා ග්‍රෙගොරිඩා වලට යන වෙනත් අලුත් පාරක් ඉදිකිරීමයි. ඒ නිසාම සෙනඟ පැමිණීම අඩුවූවේය. ඔහු එම ස්ථානය ගත්තේ ණය වෙමිනි. නමුත් අවසානයේ ණය ගෙවා ගැනීමට නොහැකි වූ නිසා එම ස්ථානය ද විකුණා දැමීය. මේ වන විට කේවිඩ්ගේ තාරුණ්‍යය ගෙවී ගොස් බොහෝ කල්ය. ඔහුට වයස අවුරුදු 66 කි. කිසිදු ආදායම් මාර්ගයක් නොමැති නිසා රජයෙන් ඩොලර් සියයක සහනාධාරයක් සෑම මසකම ලැබුනි. මේ පින් පඩියෙන් ජීවත් වන අතරම ඔහු සිතින් වයසට නොගොස් නැවත යමක් කළ යුතු බව නිරතුරුවම සිතන්නට විය. නමුත් ඔහු අත ඉතිරි වූ මුදල් කිසිවක් නොවිනි. කුමක් නැති වුවත් තම හැකියාවන් පිළිබඳව කේවිඩ් සතු වූයේ අසීමිත විශ්වාසයකි. නැවත වරක් ඔහු ඔහුගේ හැකියාවෙන් වැඩක් ගත යුතු බව අධිෂ්ඨානශීලීව සිතට ගත්තේ ය. ඔහු සතුව තිබූ ප්‍රෙෂර් කුකර් එකෙන් කුකුල් මස් බැදුම් සකසා අබලන් වූ මෝටර් රථයේ දමාගෙන ගොස් අවන්හල් හිමියන් වෙත පිළිගන්වන ලදී. එහෙත් අවන්හල් හිමියන් සියලු දෙනාම ඔහුගේ කුකුල් මස් බැදුම් ප්‍රතික්ෂේප කළෝය. ඔහු තම නිෂ්පාදන මෙලෙස අවන්හල් 1009 කට හියද ඉන් එකසිත්වත් ඒවා මිලට ගැනීමට කැමති නොවීය. නමුත් ඔහු තම උත්සාහය අත්නොහැරියේය. 1010 අලෙවි හලෙන් කුකුල් මස් බැදුම් අලෙවි කිරීමට භාර ගත්තේය. කුලු බඩු වර්ග 9 කින් එනම් රහස් වර්ගෝරුවකින් හදන කුකුල් මස් බැදුමට ලැබුනේ ඩොලර් හත 5කි. කුකුල් මස් බැදුමට මිහිසුන් දැඩි ලෙස ප්‍රියකළ නිසා විකිණෙන ප්‍රමාණය ඉහල ගොස් ආදායම දිනෙන් දින ඉහල ගියේය. ඔහු මේ කුකුල් මස් බැදුමට නම තිබේ තමින් පවන් ගන්න ප්‍රදේශයේ නම එනම් ''කෙන්ටකි බැදපු කුකුල්මස්'' (Kentaky Fried Chicken) KFC යන නාමයය. සතේ අතේ නැතිව ජීවිතය ගැටගසා ගනිමින් ජීවිතයේ අසාර්ථක වීම පමණක් හිමිකම් කියූ කේවිඩ් වයස 66 දී තම ඉතිරි කර ගත් එකම ධනය වූ ආත්ම ශක්තියත් කුකුල් මස් බැදුමේ භාස්ත්‍රයත් එකට ගොනු කර වයස 90 දී ඇමරිකාවේ ධනවත්ම කෝටිපතියන් අතරට එක්විය. පසුව ඇමරිකාවෙන් පිටත ලෝකයේ රටවල් විශාල ගණනකට KFC ජාලය විහිදන්න විය.

සිය වතාවකට වඩා අසාර්ථක වුවත් දහස්වතාවකට වඩා ප්‍රතික්ෂේප වුවත් කේවිඩ් තම ආත්ම විශ්වාසය ධෛර්යය හා උත්සාහය නිසාම ජීවිතය ජය ගත්තේය. KFC වල ඇතුලත් ගොවෝ එක කාගෙවත් නොව කේවිඩ්ගේ පින්තූරයයි. එය නිසාම නිනම් වෙළඳ ලාංඡනයක් නොව ධෛර්යමත් මිනිසෙකුගේ නොසැලෙන උත්සාහයේ ලාංඡනයයි. එම පින්තූරයෙන් අපට කියාදෙන්නේ කොතරම් අසාර්ථක වුවත් කොතරම් ප්‍රතික්ෂේප වුවත් කොතරම් වයසට ගියත් සම්කටොළු පැමිණියත් අත්නොහැරීමේ ගුණයයි. ඔබත් අද සිටම අත්නොහරින ගුණය ඔබ ජීවිතයේ සාර්ථකත්වයේ සුලුය කරගන්න.

ප්‍රේමසිරි ගමගේ
සභාපති, ව්‍යාපාර
සංවර්ධන කේන්ද්‍රය.

උසස් ජීවිතය උස් වූ කඳු මුදුණකි.

"පිවිතුරු හුස්මයි - නිල්තුරු වියනයි" තේමාව කරගනිමින් HNB ෆිනෑන්ස් නිකවැරටියෙන් හරිත වැඩසටහන් අරඹයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් වන HNB ෆිනෑන්ස් ශ්‍රී ලංකාව හරිතවත් සහ පිවිතුරු පරිසරයක් සහිත රටක් නිර්මේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහන් මාලාවේ තවත් එක් වැඩසටහනක් නිකවැරටිය මාගල්ල වැව අසල පැළ 300 ක් රෝපණය කරමින් පසුගියදා ආරම්භ කරන ලදී.

වයඹ පළාතේ පිහිටි නිකවැරටිය මාගල්ල වැව දෙස් විදෙස් සංචාරකයන්ගේ වඩාත් ආකර්ෂණයට ලක්වූ ස්ථානයක් වේ. එහි ආකර්ෂණීය බව සහ වර්ජනාකම ඉදිරි පරම්පරාවටත් රැකදීමේ අරමුණින් ඒ අවට ප්‍රධාන ස්ථාන හයක අපද්‍රව්‍ය ඉවතලන බඳුන් තබන්නු කිරීමට කටයුතු යොදා ඇති අතර පරිසරයේ වර්ජනාකම පිළිබඳ දැනුම් රැගත් දැන්වීම් පුවරු මගින් මහජනයා දැනුවත් කිරීමටත් වැව අසල පලතුරු පැළ රෝපණය කර ඒවා නිකවැරටිය HNB ෆිනෑන්ස් ශාඛාව මගින් රැකබලා ගැනීමටත් ආයතනය කටයුතු සම්පාදනය කර තිබේ.

මේ පිළිබඳව අදහස් දක්වන HNB ෆිනෑන්ස් හි කළමණාකාර අධ්‍යක්ෂ චමින්ද ප්‍රසාත් මහතා, "ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මූල්‍ය ආයතනයක් වශයෙන් අපගේ අරමුණ වන්නේ ''පිවිතුරු හුස්මයි නිල්තුරු වියනයි'' යන තේමාව පෙරදැරිව පරිසර දූෂණයෙන් තොර පිරිසිදු සහ සෞඛ්‍ය සම්පන්න රටක් නිර්මාණය කිරීමටයි.

එය අපගේ ග්‍රාහය, නිෂ්පාදනය යන සාධක වලට වඩා එහා ගිය වර්ජනා අදහසක් . මෙය සැබවින්ම මහජනතාව දැනුවත් කිරීමට සහ පරිසර හිතකාමී සමාජයක් නිර්මාණය කිරීමේ ඉතා කුඩා පියවරක් ලෙස සලකන්න පුළුවන්. මෙවැනි වැඩසටහන් තුළින් අපට පරිසර මිතුරු යහපතුරුදු නිර්මාණය කිරීමටත් එතුළින් අපගේ අනාගතයට සුවදායී පරිසරයක් දායාද කිරීමටත් හැකි වේ යැයි අප බලාපොරොත්තු වෙනවා" යනුවෙන් පැවසීය.

මෙම ව්‍යාපෘතිය සඳහා , HNB ෆිනෑන්ස් ප්‍රධාන කාර්යාලය සමගින් HNB ෆිනෑන්ස් නිකවැරටිය ශාඛාව මූල්‍යකාර්යය සෙන කටයුතු කරන ලදී.

සෙනෙහස මෛත්‍රියේ මිතුදමයි.

ණය මුදලක් නිකුත් කිරීමට පෙර ණය නිළධාරීන්ගේ අවධානයට ලක් විය යුතු ණය කොන්දේසි 4ක් (credit condition)

ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයක් සඳහා ණය නිකුත් කිරීමේදී අතිශය වැදගත් වන්නා වූ කරුණක් පිළිබඳව යළි යළිත් අපි ඔබගේ අවධානය යොමු කරන්නට සිතුවේ අන් කවරදාකටවත් වඩා වර්තමානයේ දී ඔබ මුහුණ දෙන බොහොමයක් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විය අතිශය තීරණාත්මක සාධකයක් වන බැවිනි. වර්තමාන සමාජ ආර්ථික රටාව තුළ ඔබගේ දැඩි අවධානයට ලක් විය යුතු මෙම කරුණු හතර ණය ලබාදෙන ආයතනයට සේම ණය ඉල්ලුම්කරුට ද එක සේ වැදගත් වන්නකි .

කිසියම් ව්‍යාපාරයක් සඳහා පුද්ගලික ණය මුදලක් නිකුත් කිරීමේදී බලාපාලු ලබන ණය කොන්දේසි මොනවාද යන්න පහසුවෙන් ප්‍රමිතිගත කිරීම එතරම් පහසු කාර්යයක් නොවේ. එනම් දෙනු ලබන ණය මුදල අදාල ව්‍යාපාරයේ ස්වාභාවය, ණය මුදල ගනු ලබන තැනැත්තාගේ සමාජ ආර්ථික තත්වයන් යනාදි හේතු සාධක මත විය සංකීර්ණ ස්වභාවයක් උසුලන බැවිනි. බොහෝ මයික්‍රෝ පිනන්ස් ආයතන ණය කොන්දේසි කිසියම් ප්‍රමිතිගත කිරීමකට ලක් කිරීමට උත්සාහ කළ අවස්ථා තිබුණද, ඒවා එතරම්ම සාර්ථක වූ බවක්ද නොපෙනෙන්නේ අප ඉහතින් සඳහන් කළ හේතු සාධක නිසාවෙනි. ඒ අනුව ණය නිළධාරියාට පැවරෙනුයේ වගකීම් සහගත කාර්යභාරයක් වන අතර තම ආයතනයේ පවත්නා නීති රීති හා සීමාවන් තුළ සිදුමින් ඒ ඒ ණය වර්ගයට ගැලපෙන අන්දමට ණය කොන්දේසි ව්‍යුහගත කිරීමේ වගකීම ණය භාර නිළධාරියාට පැවරේ.එම ණය කොන්දේසි ප්‍රධාන කාරණා හතරක් යටතේ අපට වර්ගීකරණයනට ලක්කළ හැකිය.

1 ණය මුදලේ ප්‍රමාණයට කොපමණද, එම ණය මුදල ලබාගන්නේ කුමක් සඳහාද
ගෙවා නිම කිරීමට ගත වන කාලය
2. ණය නැවත ගෙවීමේ සැලසුම
3. ණය ආරක්ෂණ විධිකුම (ඇප වත්කම් ආදී)
4. ලබාදෙනු ලබන ණය මුදල සඳහා දරන්නට වන පිරිවැය

කිසියම් පුද්ගලයකු සඳහා ණය මුදලක් නිකුත් කිරීමේදී ණය භාර නිළධාරියාගේ අනිවාර්ය අවධානයට ලක්විය යුතු මූලික කරුණු අතර දෙනු ලබන ණය මුදල කොපමණද, ඔහු එම ණය ලබා ගන්නේ කුමන අන්දමේ ව්‍යාපාරයක් සඳහාද, ලබා ගනු ලබන ණය මුදල ගෙවා නිම කිරීමට ඔහු කොතරම් කාලයක් ඉල්ලා සිටින්නේද යන ගැටළු ප්‍රධානය.

ණය මුදලක් ලබා දීමේදී ණය භාර නිළධාරියාට ඇතිවන ප්‍රධාන ගැටළුව වනුයේ ණය ලබාගන්නා පුද්ගලයා සතුව ඇති මුදල් ප්‍රවාහය (Cash Flow) කොපමණද යන්න පිළිබඳවය. මේ නිසා දෙනු ලබන ණය මුදලේ ප්‍රමාණය සහ ණය මුදල දෙනු ලබන කාලය යන කරුණු දෙක සන්සන්දනාත්මකව විමසා බැලිය යුතුය. විය ණය ලබා ගන්නා පුද්ගලයාගේ අවශ්‍යතාවය සහ ණය මුදල නැවත ගෙවීමේ හැකියාව යන කරුණු මත තීරණය වන්නකි.

ණය මුදල , එම ණය ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය සතුව ඇති වත්කම් සහ එහි ගුණාත්මක භාවය යන සාධකත් එම ව්‍යාපාරයේ ලාභ ඉපැයීම් යන සාධකත් මූලික කර ගනිමින් දෙනු ලබන ණය මුදල කොපමණද යන්න තීරණය කළ යුතුය. මෙහිදී ණය නිළධාරියාගේ විශේෂ අවධානය යොමු විය යුතු ප්‍රධාන කරුණක් වෙයි. එනම් ණය ඉල්ලුම් කරුව ණය උගුලකට හසු නොවන්නට වග බලා ගැනීමය.

ණය මුදල ලබාදීමේදී, ණය ඉල්ලුම්කරු සතු මුදල් ප්‍රවාහය පදනම් කර ගනිමින් එය හොඳින් විශ්ලේෂණය කර බලා අදාල ණය මුදල ලබා දීමට ණය නිළධාරියා කටයුතු කළ යුතුය. එසේම යම් හෙයකින් ණය ආපසු ගෙවීමේ අපහසුවකට ණයලාභියා මුහුණ දුන් අවස්ථාවක එම තත්වය වළක්වාදීමට ගත හැකි උපාය මාර්ග පිළිබඳව අවබෝධයක් ණය භාර නිළධාරියා සතුවීම අනිවාර්ය වේ.

නිදසුනක් විදිහට එවන් අවස්ථාවකදී හදිසි ණය මුදලක් ලබාදී ඔහුගේ ව්‍යාපාරය වැටී ඇති අවධානමෙන් මුදවා ගැනීමට කටයුතු කිරීමට ණය භාර නිළධාරියාට හැකියාව ඇත්නම් ඒ වගකීම ගැනීමට ඔහු පසුබට විය යුතු නැත.

ණය ඉල්ලුම් කරු සිය ව්‍යාපාරයේ අළෙවිය වර්ධනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද, එදිනෙදා වියදම් පියවා ගැනීම සඳහා ඔහුට අනුගමනය කළ හැකි ක්‍රමෝපායන් මොනවාද. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී එදිනෙදා විය හැකි පාඩු මොනවාද, ණය ඉල්ලුම් කරු ව්‍යාපාරය සඳහා මුදල් යොදවන ආකාරය ඔහුගේ වෙනත් ණය මුදල් පියවා ගැනීමට මෙම ණය භාවිතා කරනවාද වැනි තත්වයන් පිළිබඳව ණය භාර නිළධාරියාගේ නිරන්තර අවධානය යොමු වීම අත්‍යවශ්‍යයය.

ණය ඉල්ලුම්කරුට තම ව්‍යාපාරය පිළිබඳ මිනා අවබෝධයක් නොමැති අවස්ථා වලදී තමන් ඉල්ලුම් කරන ණය මුදල ව්‍යාපාරයේ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථා ඇති විය හැකිය. විශේෂයෙන් ව්‍යාපාරය පිළිබඳව අඩු තක්සේරුවකින් මැන බලා ණය මුදලක් ඉල්ලුම් කරන අවස්ථාවකදී අදාල ණය මුදල ව්‍යාපාරයේ ආයෝජනය සඳහා ප්‍රමාණවත් නොවිය හැකිය.ඒ පිළිබඳව ණය භාර නිළධාරියාගේ විමසුම්සහගත බව ඉතා වැදගත්ය.

ව්‍යාපාරයක් සඳහා ණය මුදලක් නිකුත් කිරීමේදී ණය බාර නිළධාරියාට පාදක කර ගත හැකි සූත්‍රයක් වෙයි. මෙය හිඳසුනක් ඇසුරෙන් මෙසේ පෙන්වා දිය හැකිය. මූල්‍ය ප්‍රවාහය රු. 30,000 වන පුද්ගලයකුට මාස 12 කින් ගෙවා අවසන් කිරීමේ පදනම යටතේ 20% පොලියකට ණය මුදලක් ලබාදිය යුතුය යන්න උපකල්පනය කළහොත් එවන් අවස්ථාවකදී මෙම සූත්‍රය ඇසුරෙන් ලබා දිය හැකි ණය මුදල් ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව අපට සොයා බැලිය හැකිය. ඒ මෙසේය.

(0.5 x මාසික ශුද්ධ මූල්‍ය ප්‍රවාහය x මාසික වාරික ප්‍රමාණය)
1 + පොලිය

$$\frac{0.5 \times 30000 \times 12}{1 + 2}$$

රු = 150000

මෙම ක්‍රමයට අනුව බැලීමේදී ඉහත ණය ඉල්ලුම් කරු සඳහා ලබාදිය හැකි ණය මුදල වන්නේ රු 150,000 මුදලකි

ණය ඉල්ලුම් කරු ඉල්ලුම් කර ඇති ණය මුදල ඔහු ව්‍යාපාරය සඳහා ආයෝජනය කර ඇති මුදලට වඩා වැඩිවිය නොහැකි බවද ණය නිළධාරියා මෙහිදී අවධාරණයෙන් සිහි තබා ගත යුතුය

HNB පිහෙන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද පුහාන් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

HNB Finance පුවත්

අවංකභාවය යනු සාර්ථකත්වයට සමීප වීමකි.

01 පිටුවෙන්

මෙම සම්මානය පිළිබඳ අදහස් දක්වන HNB ෆිනෑන්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා"ආසියාවේ හොඳම සේවා ස්ථාන 25 අතුරින් එකක් ලෙස පිදුම් ලැබීම ඇත්තෙන්ම ගෞරවයක්. කලාපයේ විවිධාංගීකරණය වූ සහ ප්‍රබල සමාගම් 25 අතර එකම මූල්‍ය ආයතනය ලෙස අප නම් කිරීම අපගේ සාර්ථකත්වයේ තවත් එක සන්ධිස්ථානයක් ලෙස හඳුන්වන්න පුළුවන්. අපගේ ගනුදෙනුකරුවන්ට උපරිම සේවයක් ලබා දීම සඳහා ආයතනික කාර්ය මණ්ඩලයට විශිෂ්ට වූ සේවා ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා හැටන් නැෂනල් බැංකුවෙන් ලැබෙන සහයෝගය ඉතා වැදගත් බව මෙහිදී අවධාරණය කල යුතු වේ.

HNB ෆිනෑන්ස් වර්ෂ 2017 දී ප්‍රමුඛ සේවායෝජකයකු ලෙස පිළිගැනීමට ලක්වූ අතර සේවය කිරීමට විශිෂ්ට ස්ථානයක් ලෙස ලෝකඩ සම්මානයෙන් පිදුම් ලැබීමට සමත් විය. එසේම 2018 දී Extra Large Sized Enterprise' කාණ්ඩය යටතේ රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. මීට අතිරේකව 2017 දී අභිමානය සහ උපදේශනය සඳහා විශේෂ සම්මානයක් HNB ෆිනෑන්ස් වෙත ප්‍රදානය කරන ලදී.

මෙම සම්මානය සඳහා නිර්දේශ කිරීම Great Place to Work කණ්ඩායම ඇතුළු Trust Index® Employee Survey සහ Culture Audit® නම් ස්වාධීන කණ්ඩායම් කීපයක් මගින් සිදු කරනු ලබයි. මෙය තනිකරම සේවකයන් අලිහව සිදුකරනු ලබන අතර සේවක ප්‍රතිපෝෂණය මත පදනම්ව ලබා දෙන සම්මානයකි.

HNB ෆිනෑන්ස් තිස්සමහරාම සේවා මධ්‍යස්ථානය අළුත් නිවහනකට

වසර 19ක් පුරා ශ්‍රී ලාංකීය පාරිභෝගික ජනතාව වෙත නමස්සිලි මූල්‍ය සේවාවන් තිළිණ කළ HNB ෆිනෑන්ස් සමාගමේ තිස්සමහාරාම සේවා මධ්‍යස්ථානය අංක 29, පල්ලියවත්ත පාර තිස්සමහාරාම යන ලිපිනයෙහි වඩාත් ඉඩ පහසුකම් සපිරි ගොඩනැගිල්ලකට පසුගියදා ගෙන යන ලදි.

අභිනව HNB ෆිනෑන්ස් තිස්සමහාරාම සේවා මධ්‍යස්ථානය සහ රන් සේවා ඒකකය HNB ෆිනෑන්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා විවෘත කොරුණි. මෙම අවස්ථාවට HNB ෆිනෑන්ස් හි නිලධාරීන් ඇතුළුව විශාල පිරිසක් එක් වුහ. රන් ණය ක්ෂේත්‍රය බැංකු සහ මූල්‍ය සමාගම් අතර ප්‍රචලිතව ඇතත් වඩාත් විධිමත්ව හා විශ්වසනීය ලෙස මෙම සේවාව සැපයීම සඳහා ඉදිරිපත් ව සිටින මූල්‍ය සමාගම් අතර HNB ෆිනෑන්ස් සමාගම වේගයෙන් ඉදිරියට පැමිණෙමින් සිටින්නේ ගනුදෙනුකරුවන් කොරෙහි දක්වන සැලකිල්ල සහ ගනුදෙනුව අභිබවා යන සුහද සේවාව යන කරුණු හේතුවෙනි. විශේෂයෙන් HNB ෆිනෑන්ස් මගින් සපයනු ලබන සියළුම මූල්‍ය සේවාවන් සේම HNB ෆිනෑන්ස් රන් ණය සේවාවද ඉතා සීඝ්‍රයෙන් පාරිභෝගික ප්‍රසාදය සහ ආකර්ෂනය දිනා ගැනීමට සමතව තිබීම විශේෂත්වයකි.

උත්සාහය ජයග්‍රහණයේ සෑපුමාර්ගයකි.

ඔහුට රැකියාව වදයක් වෙන විදිහට හැසිරුණොත් මම කළගුණ නොදන්න ගැහැණියක් වෙනවා....



මැදවච්චිය නගරය වෙනදා සේම අද්‍ද කාර්ය බහුලය. එතරම් විශාල වපසරියක් තුළ පැතිරී ගැති මැදවච්චිය නගරය පෙනෙන නොපෙනෙන දුරින් ඔහුගේ සොදුරු කැදැල්ල පිහිටා ඇත. තුරු හොමු වලින් ගහන නිසංසල පරිසරයක පිහිටි ඔහුගේ තවමත් වැඩ අවසන් කර නොමැති කැදැල්ලට අප ගොඩ වන විට මධ්‍යාහ්නය එළඹෙමින් තිබිණි.සිය රූපලාවණ්‍යාගාරයේ කිසියම් කාර්යයක නියැලෙමින් සිටි ඇය දුර සිටම දුටු අප පිළිගන්නට පෙර මගට ආවේ සිතමුසු මුහුණින් යුතුවය. "අයියා ගෙයි ඇතුළෙ දුවට පාඩම් කියලා දෙනවා. එන්න ඇතුළට.."

ඇය අයියා කියා අමතන ඔහු HNB ෆිනෑන්ස් මැදවච්චිය ශාඛාවේ ශාඛා කළමනාකරු සුරංග ද්‍රර්ශන කේරක්ය. ඇය ඔහුගේ බිරිඳ සුජාති හිලංකාය. හිමංශි රුවන්ගා සහ සෙනුකි සෙහන්සා දුවරුන් දෙදෙනාගේ මව්පිය පදවි උසුලන මේ දෙන්න දෙමහල්ලන් අතරින් සුජාති මහත්තුන්ගේ ගෙදර ගැන ඔබට කියන්නට මුල පිරුවේ මෙසේය.

මගේ උපන් ගම මැදවච්චියේ. මම ඉස්කෝලෙ ගියේ මැදවච්චිය සෙන්ට්‍රල් එකට. උසස් පෙළ දක්වාම මම ගියේ ඒ පාසැලට.මගේ තාත්තා ජල සම්පාදනයෙ සේවය කළේ. අම්මා පේශ කර්මාන්තයේ මැදවච්චිය ශාඛාවේ වැඩ කළා. මට අයියයි තංගියෙකුයි ඉන්නවා. උසස්පෙළ ඉවර වෙලා මෙහුම පාඨමාලාවක් සහ රූපලාවණ්‍ය පාඨමාලාවක් කළා.මේ සම්බන්ධයෙන් රජය මගින් පවත්වන NAQ 4 විභාගය දක්වාම මම හදාරලා තියෙනවා.

මැදවච්චියේ HNB ශාඛාවක් පිහිටුවන්න සුරංග අයියලා සවිත් මුල්ම ඩයස්ථානය පිහිටෙව්වේ අපේ ගෙදර. ඒ කාලෙ තමයි සුරංග අයියාව මට මුණ ගැසෙන්නේ. ඉන් ටික කාලයකට පස්සේ තමයි මහු මං ගැන අපේ අම්මාගෙන් අහන්නේ. ඒ වෙනකොට සුරංග අයියා ගැන සෑහෙන වැටහීමක් මගේ දෙමව්පියන්ට ඇතිවෙලා තිබුණා. අපේ අම්මයි තාත්තයි ඒ යෝජනාවට කැමති වුණා. ඉන් වසර තුනකට විතර පස්සෙ අපි විවාහ වුණා. දැන් අපි දුවලා දෙන්නෙක්ගෙ අම්මයි තාත්තයි වෙලා. අපේ ලොකු දුවට දැන් අවුරුදු තවයාගමාරයි. දෙවෙනියට හතරාමාරයි.ලොකු දුව මේ අවුරුද්දෙ ගිසපත්වෙ විභාගෙට පෙනී හිටිතවා. සුරංග අයියාගෙ කාලයෙන් වැඩ හරියක් වැයවෙන්නෙ ඔෆිස් එකේ වැඩවලට. මේ නිසා එයාට දරුවන්ගේ වැඩවලට වෙහෙසෙන්න ලැබෙන වෙලාව අඩුයි. දරුවන්ව පැති යවන්න එයාලගෙ කටයුතු ගැන හොයා බලන්න වැඩි පුරම් සිදුවෙලා තියෙන්නෙ මට. සුරංග අයියට වෙලාවක් ලැබෙන හැම වෙලාවකම එයා දරුවනුත් මාත් එක්ක ඉන්න තමයි උත්සාහ කරන්නෙ. එයා හරි කැමතියි අපි හතර දෙනා එකතු වෙලා විනෝද ගමන් යන්න. ඒත් මම ඔහුගේ රැකියාවේ ස්වභාවය තේරුම් අරන් පුළුවන් හැම වෙලාවෙම ඔහුගෙ රාජකාරි කටයුතු වලට නිදහස දෙනවා.

ගෙදර දොරේ කටයුතු දරුවන්ගෙ කටයුතු සේම ඔබේ ව්‍යාපාරයේ කටයුතුත් අතර ඔබේ දවසෙ වෙලාව වෙන්කරගන්නෙ කොහොමද...

මම ඇදුම් මැසීමේ සහ රූපලාවණ්‍ය කටයුතු සඳහා වූ මේ ව්‍යාපාරය පටන් අරන් දැන් අවුරුදු අටක් විතර වෙනවා. රූපලාවණ්‍ය කටයුතු වගේම වැඩ වෙලාවක් මට ගත වෙන්නේ සාරි ජැකට් මහන්න...ඒ කටයුතු වල සමහරක් දාට මම මැදියම් රැය වෙනතුරුත් නිරත වෙනවා.මේ කටයුතු වලදි මගේ අම්මගෙනුත් තාත්තගෙනුත් ලැබෙන උදව්ව අමතක කරන්න බෑ.

සුරංගගෙන් ලැබෙන උදව් ඔබ අගය කරන්නෙ කොහොමද

කරන පුංචි උදව්ව උනත් එයා හොයලා බලලා කරන එක සිරිතක්... බබාලා හම්බ වුණු දවස්වල මට අමාරු නිසා එයා රෑ වෙනතුරු නිදි මරාගෙන දුවලා දෙන්නවා බලාගන්නා. එයාලව නිදි කෙරෙව්වා...හැබැයි කොච්චර නිදි මැරුවත් වෙලාවට නැගිටලා වැඩට යන එක අතහැරියෙ නෑ.

ඔහුගේ රැකියාව ගැන ඔබේ අදහස

ඇත්තෙන්ම එයා කරන්නෙ වගකීම් වැඩි සමාජයේ පිළිගත් රැකියාවක්... HNB ෆිනෑන්ස් එකේ මැදවච්චිය ශාඛාවේ කළමනාකරු වදිහට ඔහුට තියෙන සමාජ පිළිගැනීම එවන් වෙනත් ෆිනෑන්ස් ආයතනයක කළමනාකරුවකුට වඩා වැඩියි කියලයි මම හිතන්නෙ... ඒක මම අත්දැකින සත්‍යයක්. අතින් අතින් අපි අපේ ජීවිතයේ ලබාගත් සෑම දෙයක්ම අපිට ලැබුණෙ මේ රැකියාව නිසා... ඒ රැකියාව වෙනුවෙන් ඔහු කරන කැප කිරීම් වලට ඔහුගෙ බිරිඳ විදිහට මම සහයෝගය නොදැක්කුවොත්, ඔහුට මේ රැකියාව වදයක් වෙන විදිහට මම හැසිරුණොත් මම කළගුණ නොදන්න ගැහැණියක් වෙනවා. සුරංග අයියා බොහොමයක් දවස්වලට එනකොට රෑ 8.00 - 9.00 වෙනවා. ඒ ඔහුගෙ රාජකාරියේ ස්වභාවය. මම ඒ තත්වය තේරුම් ගත යුතුයි.

ඔබේ අනාගත බලාපොරොත්තු ගැන කිව්වොත්

අපේ ගෙදර ඉදිකිරීම් වැඩ කටයුතු තවම ඉවර නෑ... ඉදිරියේදි ඒ වැඩ කටයුතු ඉවර කරන එක තමයි මුලිකම කාර්යය. අපේ දරුවො දෙන්නටත් හොඳින් උගන්වලා ජීවිතේ ඉදිරි කාලය සතුටින් ගෙවන එක තමයි එකම බලාපොරොත්තුව. මේ හැම දේකෙදිම HNB ෆිනෑන්ස් සමාගම අපිට ශක්තියක් වෙලා අපේ ජීවිතයේ සෑම බලාපොරොත්තුවක්ම සඵල කරගන්නට මග හසර පෑදුවා. ඒ වෙනුවෙන් මම HNB ෆිනෑන්ස් සමාගමට මගේ ස්තූතිය පිරිනමනවා...

අපේ කතා බහට මැදිහත් නොවී ඔහු සහ ඔවුන්ගෙ ගෙදර ගැන ඇය කියන සියල්ල සීනහ මුසුව අසා සිටි සුරංග අප එම කැදැල්ලෙන් සමුගෙන නික්මෙන්නට එළිපත්තට බසිද්දී අප සමග එක්වූයේ ඒ දහවල හවත් සොදුරු සන්ධ්‍යාවකින් තෙලවර වහු දැකීමේ පැතුමෙනි.

සලුමිම් කරන්න -
මංජුල ප්‍රභාත් කෙට්ටිආරච්චි
රූපා - ලක්ෂමන් කුමාරසිංහ

වඩා අගය කල යුත්තේ ආරම්භයේ සිටින හිතවතුන්ය.

ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් හිතෛෂීවන්තභාවය ඔවුන්ගේ මූල්‍ය සහකරුවා බවට අපව පත්කර ගැනීමේ තීරක සාධකයයි...

HNB ෆිනෑන්ස් හොරණ ශාඛාව

හාත්පස පැතිරුණු උස් බිම් මතින් හා වළාකුළෙන් පිරී වැහිබර කාලගුණය එසින් මවා ශූ ඇඳිරි චිත්‍රය එසින් හොරණ නගරයට දී ඇත්තේ ඊටම ආවේණිකවූ සොබාවකි. උදේ සිට ඇද හැලෙන වුරු වුරු වැස්ස ඒ හැඟුම් තව දුරටත් තීව්‍ර කරයි.රත්නපුර පානදුර පාරේ අංක 161 දරණ තැන පිහිටි HNB ෆයිනෑන්ස් හොරණ ශාඛාව එතෙක් පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලෙන් වඩාත් පහසුකම් සහිත නවමු ගොඩනැගිල්ලක් වෙත ගෙනවුත් තවමත් මාස කිහිපයකට වඩා ගෙවී නැත. නව ගොඩනැගිල්ලක සියළුම මූල්‍ය සේවාවන්ගෙන් සමන්විත හොරණ ශාඛාව මෙවර අපගේ ශාඛාවක වගතුග සඳහා නිමිත්ත සපයයි.

HNB ෆයිනෑන්ස් 37 වන ශාඛාව ලෙස හොරණ ශාඛාව ස්ථාපිත වෙනුගේ අදින් වසර14 ට පෙරාතුව 2005 අප්‍රේල් මාසයේදීය. සුවර්ණගම පිහිටුවා ගත් පළමු මධ්‍යස්ථානයෙන් ඇරඹුණු හොරණ ශාඛාවේ දශක එකහමාරකට ආසන්න වූ මේ දිගු ගමනෙහි පූර්වාපර සන්ධි ගලපාලන්නැයි අපි ඇරයුම් කළේ එහි වත්මන් ශාඛා කළමනාකරු ලෙස කටයුතු කරන උදය ඉන්දක මුදලිගේ මහතාය. පසුගිය වසර 14 ක පමණ වූ කාලයක් තුළ කළමනාකරුවන් කිහිප දෙනෙකුගේම නායකත්වය යටතේ විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් වැඩි වර්ධනය වුණු හොරණ ශාඛාවේ වර්තමාන කළමනාකාරත්වයේ වගකීම් සහ එහි සේවාවන් පිළිබඳව ඔහු වදන් ඇමුණුවේ මෙසේය.

මීට කලින් අංක 187 පානදුර පාර හොරණ යන ලිපිනයෙහි හිඳිමින් අපගේ ව්‍යාපාරික කටයුතු සිදුකළ අතර දිනෙන් දින වැඩිවන අපගේ මූල්‍ය සේවාවන් සමග වඩාත් ඉඩ පහසුකම් සහිත අංක 161 රත්නපුර පාර හොරණ යන ලිපිනයේ නව ගොඩනැගිල්ලකට පසුගිය මැයි 30 වන දින ගෙවැදීමට ලැබීම ඇත්තෙන්ම සතුටක්..එතුළින් අපේ ගනුදෙනුකරුවන් සඳහා ඔවුන්ට අවශ්‍ය සියළුම මූල්‍ය පහසුකම් සපයාදීමට අපට හැකියාව ලැබෙනවා. විශේෂයෙන් HNB ෆිනෑන්ස් සතු සුළු හා මධ්‍ය පරිමාණ ණය,ඉතුරුම් ක්‍රම,සල්බදු සේවා,රන් ණය,ක්ෂුද්‍රමූල්‍ය ණය වැනි මූල්‍ය සේවාවන් ඉතාමත් කඩිනමින් සහ විශ්වසනීයත්වයකින් යුතුව සැපයීමට අපට හැකියාව තිබෙනවා.

අද වෙනකොට අපේ කාර්ය මණ්ඩලය නිලධාරීන් 32 දෙනකුගෙන් යුක්තයි.

හොරණ ශාඛාවට අයත් අපේ මධ්‍යස්ථාන සුවිසල් ප්‍රදේශයක් පුරා විහිදී පවතිනවා. හොරණ ඉඳලා බැලූවොත් කොළඹ පාරේ කි.මී.20 පමණ දුරින් වූ ගෝරළ ඉමිදක්වා වූ ප්‍රදේශය දක්වාත් මහරගම පැත්තට කිරිවත්තුඩුව දක්වාත් හොරණ පාදුක්ක පාරේ කි.මී. 18 දක්වාත් රත්නපුර පානදුර පාරේ කිරිඇල්ලට යනකනුත් කළුතර පැත්තෙන් ගල්පාත දක්වාත් අපේ මධ්‍යස්ථාන ව්‍යාප්ත වෙලා තියෙනවා නගරාශ්‍රිතව ඇහැල්ඔය, බුලත්සිංහල,අතුර කියන නගරයන්හි අපේ මධ්‍යස්ථාන පිහිටුවලා තියෙනවා. මේ අන්දමට මේ වෙනකොට අපේ මධ්‍යස්ථාන169 මේ ප්‍රදේශයන් පුරා ව්‍යාප්තව තියෙනවා.ඒ වගේම 5000 ආසන්න ගනුදෙනුකරුවන් පිරිසක් හොරණ ශාඛාව වටා ඒකරාශීව සිය ගනුදෙනු පවත්වාගෙන යන්නේ අප ඔවුන්ගේ විශ්වාසනීය මූල්‍ය සහකරුවා බවට පත්කර ගනිමින්.

හොරණ ප්‍රදේශය ගත්තාම විශාල වපසරියක් පුරා පැතිරුණු ව්‍යාපාර දකින්න හැ. සාමාන්‍යයෙන් වගාවන් විදිහට ගත්තොත් තේ.රබර්.කුරුඳු බතුලව වගා කෙරෙනවා ව්‍යාපාර අතරින් ඇඟළුම් කර්මාන්තය,වීදි එකිම,ආහාර වර්ග නිෂ්පාදනය වගේ ව්‍යාපාර කැපී පෙනෙනවා.

ඒ වගේම තරගකාරී මූල්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් හොරණ ප්‍රදේශය තුළ ස්ථාපිතයි. ඒ නිසාම මේ අභියෝගයට මුහුණ දීම එතරම් පහසු නෑ. ඒත් අප විසින් සපයනු ලබන කාර්යක්ෂමි විශ්වසනීයත්වයෙන් යුත් සේවාවත් පෞද්ගලිකවම ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් හිතෛෂීවන්තභාවයත් ඔවුන්ගේ මූල්‍ය සහකරුවා බවට අපව පත්කර ගැනීමේ තීරක සාධකයක් වෙලා තියෙනවා.

අපි මූල්‍ය ආයතනයක් ලෙස වගේම ආයතනික සමාජ වගකීම් සම්බන්ධයෙන්ද උනන්දුවක් දක්වන ශාඛාවක් මේ වසරේදී අපේ වැලිකළ මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන නායිකාවගේ නිවස ගිනිගැනීම හේතුවෙන් ඇයගේ නිවෙස පමණක් නෙවෙයි එහි බඩු මුට්ටු දරුවන්ගේ පොත්පත් පවා මුළුමනින්ම විනාශ වුණා. ඒ අවස්ථාවිදී මෙහෙවර අරමුදලේ අනුග්‍රහයෙන් අළුතින් ගෘහ ඉදිකිරීමට අවශ්‍ය මූල්‍යමය දායකත්වය අපි ලබා දුන්නා. අපේ ගනුදෙනුකරුවන් මුහුණ දෙන ශල්‍යකර්ම ස්වාභාවික විපත් ආදියට ගිනෙම මොහොතක පිළිසරණය වෙන්නට අපි කටයුතු කරන්නේ එය අපගේ වගකීමක් ලෙස සලකාගෙනයි. එවන් වැඩසටහන් වලට අමතරව ව්‍යවසායිකාවන්ගේ ව්‍යාපාරික දැනුම වර්ධනය කරලීම සඳහා අවස්ථා කීපයක දී සංවිධානය කළ පුහුණු වැඩසටහන්, වගේම වසර පුරා එවන් එට කරනු ලබන සමාජ සත්කාරක වැඩසටහන් මේ යටතේ සඳහන් කළ හැකියි

මූල්‍ය ආයතනයක් විදිහට ලාභ අරමුණු වලටත් වඩා අප සපයනු ලබන සේවාවෙන් මේරටේ ජනතාවට වඩාත් යහපත් සේවාවක් ඉටු කිරීමටයි අපි නිරන්තරව උත්සුක වෙන්නේ. ඒ තුළින් රටේ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන ජන ජීවිතය හගා සිටුවීම සහ ඔවුන්ගේ සියළු මූල්‍ය අවශ්‍යතා එක වහලක් යටින් ඉටුකර දීම අපගේ මූලික අරමුණයි.අවසානයේ මේ සියළු ප්‍රතිලාභයන් මේ රටේ දියුණුවට යම් කිසි දායකත්වයක් සපයන්නේ නම් එයයි අපගේ සතුට.

ඛමිර ප්‍රසංසිත් (ප්‍රාදේශීය කළමනාකරු)

සුමේන්ද්‍ර මිහිරාණවිව (ප්‍රාදේශීය කළමනාකරු)

උදය මුදලිගේ (ශාඛා කළමනාකරු)

චන්න දයාලිය (ශාඛා කළමනාකරු)

සිදුත් සම්පිත (සෙවණේ වියයක විශ්‍රාම ලා මධ්‍යලාභ)

නුවන් අත්දිත (කනිෂ්ඨ කළමනාකරු කළමනාකරු ඡ්‍යෙෂ්ඨ මුදල)

නිලේෂ් අතලන්ත (කනිෂ්ඨ කළමනාකරු ඡ්‍යෙෂ්ඨ මුදල)

ජනක මෙන්ඩිස් (අංශ මාර්ග - ලීසිං)

ජීවිතය යනු පිටුවෙන් පිටුවට කියවිය යුතු පොතකි.

"HNB Finance IQ Master දෙ
අවසන් මහා තරගය අති උත්කර්ෂ
නිමාවට පත්වෙයි.

ශ්‍රී ලංකාව පුරා විසිර සිටින HNB ෆිනෑන්ස් සේවක මඩුල්ලේ දැනුම උරුමා බලන අන්තර් සේවක බුද්ධි කලම්බනය වන IQ Master තරගාවලියේ Season 3 අවසන් මහා තරගය පසුගියදා අති උත්කර්ෂවත් අන්දමින් නිමාවට පත් වූ අතර HNB ෆිනෑන්ස් ප්‍රධාන ශාඛාවේ උදාර සම්පත් කුලසූරිය IQ Master අවසාන මහා තරගයේ ජයග්‍රාහකයා බවට පත්විය. මිරිහාන රැෆල්ස් රෙසිඩන්ස් හි පැවති අවසන් මහා තරගය HNB ෆිනෑන්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි චමින්ද ප්‍රභාත් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර 2019 වසරේදී

අඛණ්ඩව තෙවැනි වරටත් පැවති තරගය සඳහා තරගකරුවන් 813 කට අධික සේවක පිරිසක් මූලික වටයට ඉදිරිපත් වූහ. ඉන් 100 දෙනෙකුන් දෙවන තරග වටය මගින් සහ අවසාන වටය සඳහා තරගකරුවන් 16 දෙනෙකු තෝරා ගන්නා ලදි. එම තරග කරුවන් 16 දෙනා අතර Fastest finger first තරග වටය බැගින් පවත්වා තරගකරුවන් පස්දෙනකුට අවසන් මහා තරගය සඳහා තරගකිරීමේ Hot seat අවස්ථාව ලබාදෙන ලදි.

IQ Master බවට අභිශේක ලැබූ උදාර සම්පත් කුලසූරිය මහතාට ප්‍රශ්න වලට පිළිතුරු දීමෙන් ලබාගත් මුදල් ත්‍යාගයට අමතරව විදෙස් සංචාරයක් හෝ එම වටිනාකමට සමාන වටිනාකමකින් යුත්

පසුගිය වසරේ සාමාන්‍ය පෙළ 9 සාමාර්ථයක් නිමිකරගත් අප කාර්ය මණ්ඩලයේ මහේෂ් උදය මහතාගේ පුත්‍ර වූ ලහිරු නිර්මල් අගැයුමට ලක්වූ මොහොත...

අභිමත පාඨමාලාවක් හැදෑරීම සඳහා අවස්ථාවක්ද සෙලිග්කෝ සාමාන්‍ය සහ සෙලිග්කෝ ලයිෆ් යන ආයතනයන්ගේ අනුග්‍රාහකත්වයෙන් පිරිනැමූ රුපියල් මිලියන 2 ක්වූ හදිසි අනතුරු රක්ෂණයක් සහ රුපියල් ලක්ෂ දෙකක් වටිනා ජීවිත රක්ෂණයක් පිරිනැමූ අතර වටිනා ජංගම දුරකථනයක් ද නිමි විය.

2018 අගෝස්තු පවත්වන ලද CIMA විභාගයට පෙනී සිටිමින් උක්ත විභාගයෙන් රන් පදක්කමක් හිමි කරගත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඇනස්ලි ප්‍රනාන්දු මහතාගේ දියනිය වූ ශනාලි ප්‍රනාන්දු මෙනෙවිය ඇගයුමට පාත්‍ර වූ මොහොත

Hot Seat අවස්ථාව සඳහා තේරුණු සෙසු තරගකරුවන් හතර දෙනාට ප්‍රශ්න වලට පිළිතුරු දීමෙන් ඔවුන් දිනාගත් මුදල් ත්‍යාග වලට අමතරව සෙලිග්කෝ සාමාන්‍ය රක්ෂණ ආයතනයේ අනුග්‍රහයෙන් පිරිනමන ලද රුපියල් 750,000 ක් වූ

ලේස් බුක් තරගයේ ජයග්‍රහකයා ලබාගත් නුවර එළිය ශාඛාවේ මහතා අධ්‍යක්ෂිකා ක්‍රිශාන්ති ත අතින් නිළිණ ලද මොහොත

හදිසි අනතුරු රක්ෂණයක් අවස්ථාව ලැබිණ IQ Master තරගාවලිය සංවිධා

තරගයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍ය දෙමින් HNB Finance IQ Ma දිනුම අවසන් මහා තරගයේ ජය ගත් ප්‍රධාන කාර්යාලයේ උදාර චමින්ද ප්‍රභාත් මහතා අති මොහොත

කොනෙකුට දිය හැක්කේ බුද්ධිය නොව දැනුමයි.

ැනුමෙන් දිනුම" ශවත් ලෙස

"ෆේස් බුක් තරගයේ ජනප්‍රියම තරගකරුවා" ප්‍රධාන කාර්යාලයේ උදාර සම්පත් මහතා අධ්‍යක්ෂිකා ක්‍රිශාන්ති තම්බයියා මහත්මිය අතින් තිළිණ ලද මොහොත

කාර්ය භාරයක් ඉටුකළ HNB ෆිනෑන්ස්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන) රුවන් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් "දිවයින පුරා විසිර සිටින HNB ෆිනෑන්ස් කාර්ය මණ්ඩලය දැනුමින් සන්නද්ධ කරවීම සහ නව දැනුම සොයා යාමට අපගේ සේවකයින් දිරිමත් කිරීමත් වෘත්තීය ජීවිතය සහ පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සැකසීමත් මෙම තරගාවලියෙහි අරමුණු අතර ප්‍රධාන තැනක් ගන්නවා. සේවකයින් අතර සුහදතාව වර්ධනය කිරීම සඳහා වාර්ෂිකව තරග හා වැඩසටහන් ගණනාවක් මානව සම්පත් අංශයේ මූලිකත්වයෙන් දියත් කරනු ලබන අතර මෙම තරගාවලියේ ජයග්‍රාහකයින්ට හිමිවෙන ප්‍රතිලාභ පිළිබඳව අවධානය යොමුකරන විට HNB Finance IQ Master තරගාවලිය වඩාත් සුවිශේෂ බව හිසැකවම පැවසිය හැකියි. මෙවන් තරගයක් සඳහා මූලික යෝජනාව ඉදිරිපත් කරමින් ඒ සඳහා අපට පූර්ණ අනුග්‍රාහකත්වය ලබාදෙන අප සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ චමින්ද ප්‍රනාන්ද මහතාට මගේ සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තුතිය පුදකිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම තරගයේ නිවේදන කාර්ය ඉටුකළ ප්‍රගීත් වික්‍රමසූරිය මහතාටත් මේ සඳහා ත්‍යාග සහ මූල්‍යමය අනුග්‍රහය ලබාදුන් අනුග්‍රාහක ආයතනවලටත් HNB ෆිනෑන්ස් හි අවංක ආදර ස්තුතිය පිරිනමනවා" යනුවෙන් පැවසිය.

ට අදාල ත්‍යාගය
ි විෂ්ණු කුමාර්
ිබයියා මහත්මිය

දිනා ගැනීමටද

නයෙහිලා තියමු

වකට පිළිතුරු
ster දැනුමෙන්
ුහනය හිමි කර
සම්පත් මහතා
ි ත්‍යාග ලද

අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය විශ්‍රාම ගනී

HNB ෆයිනෑන්ස් හි අධ්‍යක්ෂිකාවක ලෙසින් 2013 වසරේ සිට කටයුතු කළ ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය පසුගියදා සිය සේවයෙන් විශ්‍රාම ගත්තේ HNB ෆයිනෑන්ස් සමාගමට අමිල වූ කෘතහස්ත සේවාවක් සපයමිනි. ආයතනයේ ප්‍රගමනය උදෙසා සහ එය නිවැරදි දිශානතියක් ඔස්සේ මෙහෙයවීමට කළමනාකාර අධ්‍යක්ෂ චමින්ද ප්‍රනාන් මහතාට සිය උපරිම සහයෝගය ලබාදුන් තම්බයියා මහත්මිය HNB ෆිනෑන්ස්හි අධ්‍යක්ෂිකා (ශාඛා ජාල) ලෙස කටයුතු කරන අතරේම සුළු පරිමාණ ණය සේවාවන් අධීක්ෂණය

කරමින් ඒවා ජනතාවට වඩාත් සමීප හා කාර්යක්ෂම ණය සේවාවන් ලෙස රටතුළ ප්‍රචලිත කිරීමට සිය කාර්ය මණ්ඩලය මෙයෙවමින් ගත් වෙහෙස සහ මග පෙන්වීම ආයතනයේ කුඩු මහත් සෑම අංශයකම ප්‍රශංසාවට ලක්වූයේ නිතැතිනි.

තම්බයියා මහත්මිය අප සමාගමේ සිය සේවා කාලය හිමි කිරීම සනිටුහන් කරමින් ඇය විසින් ඉටුකරන ලද සේවය අගය කිරීම සඳහා ජුබිලිකණුව රැෆල්ස් රෙසිඩන්ස්හිදී පවත්වන ලද සමුගැනීමේ හමුව අප ඡායාරූප ශිල්පීන්ගේ කැමරා ඇසෙහි සනිටුහන්ව තිබුණේ මෙලෙසිනි

සාර්ථක ජයග්‍රාහකයා ඉලක්කයක් ඇතිව තරඟ වදින්නේය.

HNB ෆිනෑන්ස් රන් ණය සේවා මහනුවරට, සහ වලපනේට

වසර 19ක් පුරා ශ්‍රී ලාංකීය පාරිභෝගික ජනතාව වෙත නමස්සිලී මූල්‍ය සේවාවන් තිළිණ කළ HNB ෆිනෑන්ස් සමාගම සිය රන් ණය සේවාව මධ්‍යම පළාත තුළ ශක්තිමත්ව ව්‍යාප්ත කරමින් HNB ෆිනෑන්ස් මහනුවර ශාඛාවේ සහ වලපනේ සේවා මධ්‍යස්ථානයහි රන් ණය සේවා පසුගියදා ආරම්භ කළේ.

HNB ෆිනෑන්ස් මහනුවර සහ වලපනේ රන් ණය සේවා ඒකකයන් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) රුවන් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා විවෘත කෙරිණ. මෙම අවස්ථාවට HNB ෆිනෑන්ස් හි නිලධාරීන් ඇතුළුව විශාල පිරිසක් එක් වූහ.

HNB ෆිනෑන්ස් සමාගම අවම පොලියක් සමග කැරට් 22 රන් භාණ්ඩ සඳහා මූල්‍ය

සමාගම් අතර ඉහළම මිලක් ලබා දීමට කටයුතු කරන අතර කලින් දැනුම් දීමකින් තොරව ඕනෑම විටකදී එම රන් භාණ්ඩ නිදහස් කර ගැනීමට හෝ රන් ණය අලුත්කරවා ගැනීමට අවස්ථාව ද පාරිභෝගිකයින්ට ලබා දී ඇත. එමෙන්ම රන් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී ලබා ගත් ණය මුදල මාසික වාරික වශයෙන් ගෙවීමේ හැකියාව හා රන් භාන්ඩ කොටස් වශයෙන් නිදහස් කර ගැනීමේ හැකියාව පවතින අතර පාරිභෝගිකයින්ගේ රන් භාණ්ඩ සඳහා උපරිම ආරක්ෂාව සැලසීමට ද HNB ෆිනෑන්ස් කටයුතු කර ඇත.

HNB ෆිනෑන්ස් රන් ණය සේවාව මේ වනවිට ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 26 ක ක්‍රියාත්මක වන අතර නුදුරේදීම දීප ව්‍යාප්ත HNB

ෆිනෑන්ස් සියළුම ශාඛාවන් සහ සේවා මධ්‍යස්ථානයන් තුළින් ලබා ගැනීමේ පහසුකම පාරිභෝගිකයින් වෙත ලබා දීමට HNB ෆිනෑන්ස් අපේක්ෂාවෙන් සිටී.

අභිනවයෙන් විවෘත වූ HNB ෆිනෑන්ස් මහනුවර සහ වලපනේ රන් ණය සේවා ඒකකයන් පිළිබඳව අදහස් දක්වන HNB ෆිනෑන්ස් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) රුවන් ප්‍රනාන්දු මහතා '' වසර 16කට අධික කාලයක් මුළුල්ලේ HNB ෆිනෑන්ස් සිය මූල්‍ය සේවා මහනුවර ඇතුළු මධ්‍යම පළාතේ අනෙකුත්

ප්‍රදේශයන් වෙත ව්‍යාප්ත කරමින් පාරිභෝගිකයින් වෙත වඩාත් සුහදශීලී සේවාවක් ලබා දීමට සමත් ව සිටිනවා. පාරම්පරික කලා ශිල්ප, සංචාරක කර්මාන්තය සහ කෘෂිකර්මික ආර්ථික කටයුතු වල නියැලී සිටින මධ්‍යම පලාතේ පාරිභෝගික අවශ්‍යතා සඳහා ඔවුන්ටම ගැලපෙන මූල්‍ය සේවා ලබා දීම අපගේ අරමුණයි. මේ අතර අලුතින් හඳුන්වාදෙන අපගේ රන් ණය සේවාව තුළින් ඔවුන්ගේ

හදිසි මූල්‍ය අවශ්‍යතා වඩාත් විශ්වාසදායී ලෙස සපුරාලීමට අපට හැකි වේවි. '' යනුවෙන් පැවසීය."

විශ්වාසය සෞභාග්‍යයේ පදනමයි.

ඒ ඇය මගෙන් ඉල්ලූ අවසාන ඉල්ලීම...

- ප්‍රාදේශීය කළමනාකරු ශමීර ප්‍රසංගීත් -

■ සම්පූර්ණ නම :- හෙන්ද හේවගේ ශමීර ප්‍රසංගීත්

■ උපන් දිනය :- 1985.11.12

■ ඔබේ ළමා කාලය සිහිපත් කළොත් :- මගේ ගම ගෝනපොළ ඒක හොරණට ආසන්නයේ ගමක් අපේ ගෙවල් තිබුණෙ හොරණ නුවර පාරේ කුඹුක හන්දිය කිට්ටුව. අද වෙන කොට යම් තරමකට දියුණු වුණත් ඒ කාලේ ඇළ දොළ වෙල් ගළකැලෑ වලින් පිරුණු සුන්දර ගමක්. අපේ තාත්තා මම දන්න මුල්ම කාලේ සයිකල් අළෙවි සැලක් කරගෙන ගියා. ඊක කාලයකින් ඒක මහප්පාට භාරදීලා තාත්තා කුඹුරු ගොවිතැන් එළවළු බුලත් වගේ වගාවන් කරන්න පටන් ගත්තා. මට වැඩිමල් අක්කලා තුන්දෙනෙක් ඉන්නවා ලොකු අක්කා මට වඩා අවුරුදු 21 කින් වැඩිමල් දෙවෙනියා අවුරුදු 19 කින් වැඩිමල් ඒ දෙන්නම රැකියාවල් කළා. අම්මා රැකියාවකට ගියේ නෑ. ගොහොම වුණත් පුංචි කාලේ අපිට දරුණෙන ආර්ථික අපහසුතාවක් තිබුණේ නෑ.

■ පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම

■ පාසැල :- බප/හො/පලන්නොරුව මධ්‍ය මහා විද්‍යාලය මගේ පාසැල. අපේ ගෙදර ඉඳන් ඉස්කෝලෙට තිබුණෙ කි.මී.3 විතර දුරක්. අපි ඒ දුර ආවෙ ගියේ පයින්. ඉස්කොලෙ ඇරිලා අපි ගෙදර ආවේ ඇලවල් වලට පැනලා නාලා. අනුන්ගෙ වතු වලට රිංගලා තියෙන දෙයක් කාලා. ළමා වියට අදාල දෂකාරකම් වලින් අපේ ළමා කාලය පිරිලා තිබුණා. අපි හැදුනේ ගඟ කොළ ඇල දොළින් සැදුණු සොබා දහමින් එක්ක. පලන්නොරුව මධ්‍ය මහා විද්‍යාලය මගේ ප්‍රියතම පාසැල වුනේ මම ගිය එකම පාසැල ඒක වුණු නිසා නෙවෙයි. පාසැලෙ පරිසරය ගුරුවරුන් තුළ තිබුණු සුහද බව ඒ පාසැලට ආදරය කරන්න අපිව පෙළඹෙව්වා. මම උසස් පෙළට කළේ වාණිජ විෂයයන්.පළවෙනි පාර කැම්පස් යන්න ලකුණු මදි වුණත් දෙවෙනි පාර ආයිත් විභාගෙ කළේ නෑ. මොකද අක්කලාට තව දුරටත් බරක් වෙන්න මට හිතුනේ නෑ.

■ විෂය :- සාමාන්‍ය පෙළ වෙනතුරු ගණිතයට තමයි මගේ වැඩි කැමැත්තක් තිබුණෙ. උසස්පෙළ පංතියට ආවාම ගණකාධිකරණය විෂය මගේ ප්‍රියතම විෂයය වුණා.

■ ක්‍රීඩාව :- ක්‍රිකට්,වොලිබෝල් ක්‍රීඩාවන්ට මගේ වැඩි කැමැත්තක් තිබුණා.පළාත් මට්ටමින් අවස්ථා කීපයකදීම ජයග්‍රහණය කරන්න හැකිවුණා

■ පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :- මම මුල් කාලයේ කැමැත්තෙන් හිටියෙ හමුදාවට බැඳෙන්න. 2004 දෙසැම්බර් වලදී මම හමුදාවේ සම්මුඛ පරීක්ෂණ වලට ගිහින් ඒවායිනුත් තේරුණා. ඒත් අම්මගෙ දැඩි අකැමැත්ත හේතුවෙන් මට ඒ අදහස අත්හැර ගන්න සිද්ධ වුණා.

■ මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :- හමුදාවෙ වැඩෙන් අත්හැර දාලා ඊට දවසක් ගෙදර ඉන්න කොට ග්‍රාමීන් සමාගමේ සේවය කරපු සමීර චන්ද්‍රනාත් මහතා තමයි ග්‍රාමීන් එකේ රැකියාවට මාව දැම්මෙ. ඒ උදව්ව මේ මොහොතෙ මම කෘතඥතාවෙන් සිහිපත් කරනවා.මම ග්‍රාමීන් එකේ රැකියාවට ආවේ 2005 ඔක්තෝබර් 03. මුලින්ම ක්ෂේත්‍ර නිලධාරියෙක් විදිහට මම මොරටුව ශාඛාවේ ෂොප් හවුස් එකේ අවුරුද්දක් වැඩ කළා. ඊට පස්සෙ හොරණ ශාඛාව පටන් ගනිද්දි 2006 ඔක්තෝබරිවල මාව ඒකට අනුයුක්ත කළා. මාස 06 විතර හොරණ වැඩ කරද්දි මට උසස්වීමක් හම්බ වුණා ක්ෂේත්‍ර කළමනාකරු විදිහට හොරණ ශාඛාවේ ෂොප් හවුස් එකේ. ආයතනය තුළ පියවරෙන් පියවර ඉදිරියට ආපු ගමනක් මේ. මම මෙතෙක් වැඩ කරපු එකම ආයතනය මේක වුණත් මම හිතනවා අහිත් කිසිම තැනකින් ලැබෙන්නෙ නැති සතුටක් තෘප්තියක් මට මේ රැකියාවෙන් ලැබුණා කියලා.

■ ජීවිතේ අමතක නොවන සිද්ධිය :- 2010 ඔක්තෝබර් මාසෙ 12 වෙනිදා අපේ අම්මා මට කෝල් එකක් ගත්තා. එයා කිව්වෙ රෑට බත් කන්න බෑ එනකොට කොත්තුවක් අරන් එන්න කියලා. සාමාන්‍යයෙන් අම්මා එහෙම කියන්නෙ නෑ.එදා රෑ අම්මා කනකොට එකපාරටම අම්මගේ අතින් බත් පිඟාන වීම වැටුණා. ඉස්පිරිතාලෙට ගියාම තමයි දැනගන්න ලැබුණෙ අම්මා අංශඝාත තත්වෙ ඉන්නෙ කියලා. එදාම රෑ මගේ ඔඩොක්කුවෙම අම්මා නැතිවුණා.ඒ දවස සහ ඒ සිද්ධිය මට කවදාකවත් අමතක වෙන්නෙ නෑ.ඒ සිද්ධියත් එක්ක මම ගෙදර තනිවෙනවා. මොකද අම්මයි මමයි විතරයි ඒ ගෙදර හිටියේ. අක්කලා බැඳලා ගිහින්.අම්මා නැතිවුණාට පස්සෙ මම දෙවෙනි අක්කලාගේ ගෙදර පදිංචියට ගියා.

■ ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය:- වඩාත්ම සතුටට පත්වුණේ මුල්ම මගේම කියලා වාහනයක් ගත්තු දවසෙ ඒ 2015 මැයි 06. වඩාත්ම දුකට පත්වුනේ අම්මා නැතිවුණු දවසේ

■ අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :- මගේ ප්‍රමා කාලය විශේෂයෙන් 10,12 කාලයෙන් පස්සේ ගමේ යාළුවොත් එක්ක ජීවිතේ කිසි බරපතලක් නැතිව සැහැල්ලුවෙන් ගෙවිච කාලයක් තිබුණ. අදත් මම ඒ කාලයට කැමතියි.

■ ජීවිතයට අභිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව :- මගේ අම්මා. මට අවුරුදු 11 දි තාත්තා නැති වුණා. තාත්තත් නැතිව අපිව හදාවඩා ගන්න අම්මා කරපු සැප කිරීම් මට තවම මතකයි. අම්මයි මමයි විතරක් ගෙදර ජීවත්වුණු කාලයේ අම්මගේ දුක සැප වඩාත්ම හොයා බැලුවෙ මම...ඇය නැතිවීම මගේ ජීවිතයට ඉතා දැඩි බලපෑමක් කළ කාරණයක්

■ හර් ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :- මිනිස්සුන්ව ඕනවට වඩා විශ්වාස කරන එක තමයි මට හිතෙන්නෙ මගේ තියෙන ලොකුම දුර්වලකම. විශේෂයෙන්ම ඔවුන්ට නිදහස දීලා ඔවුන්ගෙන් අදාළ රාජකාරිය ඉටුකර ගැනීමට මම කැමතියි. ඒත් ඒ නිදහස ඔවුන් අයුතු විදිහට පාවිච්චි කරලා ඒ ප්‍රශ්න වලට මට මැදිහත්වෙන්න සිදුවුන අවස්ථා ඕන තරම් ඒත් ඒ වැරැද්ද හිවැරදි කර ගන්න තාවමින් මට පුළුවන් වෙලා නෑ.

■ ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ :- පිරිසක් එක්ක වැඩ කරන්න, ඔවුන්ව මෙහෙයවමින් රාජකාරි ඉටුකර ගැනීමට මට යම් හැකියාවක් තියෙනවා. එහෙම බැලුවාම මම අද මට ගැලපෙන තැන ඉන්නවා කියලා හිතෙනවා.

■ ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය :- මගෙ සහෝදරියෝ තුන්දෙනාම මට විශේෂයි. මට මිල්ලි කොනෙතුටත් වඩා එයාලගේ දරුවෙක් විදිහට තමයි සලකන්නේ. ඔවුන් මට වැඩිපුරම පුතා ළමයා කියලා තමයි කතා කරන්නෙත්. රට හිටියත් ලොකු අක්කා දවසකට පාරක්වත් මට කතා කරනවා. ඔවුන් විවෘතව සහ සරලව ඕනම ප්‍රශ්නයක් දිහා බලනවා

■ පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :- ආදර සම්බන්ධතාවන්නම් කීපයක්ම තිබුනා ඉස්කෝලේ කාලෙදී පවා ඒත් ඒ අතරින් විශේෂ වෙන එකක් තිබුනා එයා මම පුංචි කාලේ ඉඳලම දන්න කෙනෙක්. මම ඇයට ආදරේ ප්‍රකාශ කළ වෙලාවේ එයා කිව්වේ ඇවිත් ගෙදරින් අහන්න කියලා ඒත් මම ඇහුවෙ නෑ. නිසි වෙලාවෙදි නිසි තීරණයක් නොගැනීමේ වරද නිසා මට ඇයව අහිමි වුණා. එයා වෙන කෙනෙක් එක්ක විවාහ වුණා

■ එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :- ඇගේ තිබුණු විශේෂත්වය තමයි එයා කියන්න තියෙන දේ කෙළින්ම මුණට කියනවා. ඒ ගතිගුණයට මම කැමතියි.

■ ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :- ජීවිතයේ සමහර දේවල් වලින් මම තෘප්තිමත් නෑ. ඒත් මම මගේ රැකියාව ගැන තෘප්තිමත්. ඒ වගේම පියවරෙන් පියවර මේ දක්වා මම ආපු ගමන ගැන තෘප්තිමත්

■ ඔබේ ජීවිතය වෙනස් කළ තැරවුම් ලක්ෂය (terning Point):- මම ආමි එකට යන්නේ නැතුව ග්‍රාමීන් එකට සම්බන්ධ වෙන්න ගත්තු තීරණය

■ ඔබේ ප්‍රියතම

ගායකයා :- වික්ටර් රත්නායක මහත්තයා

ගීතය :- අපි හැඟුම් වලට ඉඩ දී මොහොතක්

චිත්‍රපටිය :- ෂර්ලොක් හෝම්ස්ගේ චිත්‍රපටි කතා මාලාවම මං බැලුවා. මම ඒ චිත්‍රපටිවලට කැමති

කතිය :- ෂර්ලොක් හෝම්ස්ගේ කතා ඇතුළත් පාතර් කොහන් ඩොයිල්ගේ පොත් වලට මම කැමතිය

■ අනාගත ඉලක්කය :- මේ වෙනකොට ජීවිතයේ ඉලක්ක බොහොමයක් මං සම්පූර්ණ කරගෙනයි තියෙන්නෙ ඉදිරියේදීත් සමාජයට වැඩදායී යහපත් පුද්ගලයකු ලෙස ජීවත්වීමයි මගේ බලාපොරොත්තුව

සාකච්ඡා කළේ -
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

සැකය, අබාග්‍යයේ දෝංකාරයයි.

ආයතනයේ වාසියට නඩු තීන්දුවක් ලද පසු.....

චංචල දේපලක් තහනමට ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳව මූලික හැඳින්වීමක් පසුගිය කලාපයෙන් අනාවරණය කළ අතර අද පළවන්නේ එහි දෙවන කොටසය. චංචල දේපලක් තහනම් කර අධිකරණය වෙත වෙන්දේසි ලේඛණ ගොනු කිරීමෙන් අනතුරුව එම වෙන්දේසිය සඳහා අවසර ලද අවස්ථාවකදී, අදාල දීසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හමුවේ වෙන්දේසිය සඳහා දිනයක් වෙන්කරගැනීම සිදුකළ යුතුය. ඉන්පසුව වෙන්දේසි ලේඛණ සමග ගොණුකල වෙන්දේසියේ අදාල භාණ්ඩ සහ වෙන්දේසිය සිදුකරනු ලබන දිනය සහ වේලාව ඇතුලත් දැන්වීමක් එම විත්තිකරුවන් වෙත ලියාපදිංචි තැපෑල මගින් වෙත හිතුත්තිරීම සිදුකරයි.

එසේ සිදුකිරීමෙන් පසුද විත්තිකරුවන් මුදල් ගෙවීමට කටයුතු සිදු නොකරයි නම් දීසා අධිකරණයේ පිස්කල්වරයෙකු සමග විත්තිකරුවන් පදිංචිව සිටින ගම් ප්‍රදේශයේ සහ ප්‍රසිද්ධ ස්ථාන වල දැන්වීම් ඇලවීම සිදු කරන අතර ඉන් අනතුරුව රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙන්දේසිය සඳහා ලබාදුන් දිනට මාසයක කාලයකට ප්‍රථම එම දැන්වීම් පුවත්පත් තුළ පලකළ යුතුය. ඉන් අනතුරුව වෙන්දේසිය සිදුකිරීමට සතියක කාලයකට ප්‍රථම හැවතත් පිස්කල්වරයකු සමග ගොස් විත්තිකරුවන් පදිංචි ගම් ප්‍රදේශ වල සහ ප්‍රසිද්ධ ස්ථාන වල හැවතත් දැන්වීම් අලවා ප්‍රසිද්ධ කළ යුතුය.

තවද මෙම වෙන්දේසි සිදුකිරීමට බොහෝ දීසා අධිකරණයන් වල රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපත් වන අතර එසේ නොවන අවස්ථාවකදී පැමිණිල්ල විසින් වෙන්දේසිකරුවකු සම්බන්ධීකරණය කරගත යුතුය. (උදා- ජොක්මන් ඇන්ඩ් සමරවික්‍රම) රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපත් වන අවස්ථාවේදී පෙරදී අප දේපල තහනම සඳහා පිස්කල් බදා ලෙස රු.1,500/- ක් අධිකරණයේ තැන්පත් කළ සේම වෙන්දේසිය සඳහාද මුදල් තැන්පත් කර පොලිස් හිලධාරීන්ද පෙර පරිදිම සපයා ගැනීම සිදුකරගත යුතුය.

ඉන් අනතුරුව වෙන්දේසිය සිදුකරන ස්ථානයට ගොස් රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙන්දේසිය සිදුකරන බවට නිවේදනය කරයි. ඉන් අනතුරුව එක් එක් භාණ්ඩ තහනම්කල අවස්ථාවේ ලකුණුකරගන්නා ලද මිල ගණනින් ලංසුව ආරම්භ කරයි. එහිදී එක් එක් භාණ්ඩයන් ඉල්ලුම් කරනු ලබන ඉහලම ලංසුවට එම භාණ්ඩ ලබාදීම සිදුකරයි. යම්හෙයකින් මෙම භාණ්ඩ වෙන්දේසියට පුද්ගලයින් එම භාණ්ඩ ලබාගැනීමට ඉදිරිපත් නොවුනහොත් එම භාණ්ඩ පැමිණිලිකරු වෙත ලබාදීම සිදුකරයි.

තවද වෙන්දේසියේදී යම් පුද්ගලයෙකු එම භාණ්ඩ මිලදී ගනී නම් එම මුදල් පැය 24 ක් ඇතුලත අධිකරණයේ නඩු අංකයට අදාලව තැන්පත් කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදුකරනු ලබයි. තවද යම් හෙයකින් මෙම වෙන්දේසිය වෙන්දේසිකරුවකු ලවා සිදුකරන අවස්ථාවකදී පුද්ගලයින් විසින් මෙම භාණ්ඩ මිලදී ගැනීම සිදු නොකරන අවස්ථාවකදී එම භාණ්ඩ තහනම් කරන ලද අවම වටිනාකම මුදල් වෙන්දේසිකරු විසින් ලබාදී භාණ්ඩ ලබාගැනීම සිදුකරයි. රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙන්දේසි කටයුත්ත සිදුකරනු ලබන අවස්ථාවකදී මෙම භාණ්ඩ පැමිණිලිකරුවෙත ලබාදීම සිදුකරයි.

❖ නිශ්චල දේපල තහනමට ගැනීමේදී ...

ඉහතින් සඳහන් කළ ආකාරයට චංචල දේපල පමණක් නොව නිශ්චල දේපලද තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාල මුදල් අයකරගැනීම සිදුකල හැකිය. මෙහිදී පැමිණිලිකරු විසින් විත්තිකරුවන්ට අයත් නිරවුල් දේපලක් පෙන්වාදීම සිදුකළ යුතුය. මෙහිදී විත්තිකරුවන්ට අයත් ඉඩමක ඔප්පු පිටපතක් සොයාගැනීමෙන් එම ඔප්පු අංකයට අදාලව ඇති අවසන් පත්තරු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් ලබා ගනිමින් එහි නිරවුල්භාවය අධිකරණය වෙත ලේඛණ ඉදිරිපත් කර පෙන්වාදිය යුතුය. එසේ ඔප්පු පිටපතක් සොයාගැනීමට නොහැකිනම් විත්තිකරුවන්ගේ යැයි හැඟෙන ඉඩමක් ආසන්නයේ ඇති ඉඩමක ඔප්පු පිටපතක් සොයාගත හැකිනම් එම ඉඩමට අදාලව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නීතිඥයෙකුගේ සහයෙන් පත්තරු පරීක්ෂාවක් මගින් එම ඉඩමට අදාලව අවශ්‍ය තොරතුරු සොයා ගැනීම සිදුකළ හැකිය. දිනය සහ වේලාව ඇතුලත් දැන්වීමක් එම විත්තිකරුවන් වෙත ලියාපදිංචි තැපෑල මගින් විත්තිකරුවන් වෙත හිතුත්තිරීම සිදුකරයි.

එසේ සිදුකිරීමෙන් පසුද විත්තිකරුවන් මුදල් ගෙවීමට කටයුතු සිදු නොකරයි නම් දීසා අධිකරණයේ පිස්කල්වරයෙකු සමග විත්තිකරුවන් පදිංචිව සිටින ගම් ප්‍රදේශයේ සහ ප්‍රසිද්ධ ස්ථාන වල දැන්වීම් ඇලවීම සිදු කරන අතර ඉන් අනතුරුව රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙන්දේසිය සඳහා ලබාදුන් දිනට මාසයක කාලයකට ප්‍රථම එම දැන්වීම් පුවත්පත් තුළ පලකළ යුතුය. ඉන් අනතුරුව වෙන්දේසිය සිදුකිරීමට සතියක කාලයකට ප්‍රථම හැවතත් පිස්කල්වරයකු සමග ගොස් විත්තිකරුවන් පදිංචි ගම් ප්‍රදේශ වල සහ ප්‍රසිද්ධ ස්ථාන වල හැවතත් දැන්වීම් අලවා ප්‍රසිද්ධ කළ යුතුය.

එසේ සොයාගැනීමත් කල අවස්ථාවකදී අදාල ලේඛණ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සහ ඒ පිලිබඳව අධිකරණයේ කරුණු සහවුරු කිරීමෙන් පසුව අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමුකර එම ඉඩම නැවත අධිකරණයේ ආඥාවක් ලැබෙන තෙක් පැවරීම සිදුකිරීම අවලංගු කරනු ලබයි.

එසේ අවලංගු කිරීමේ ලේඛණ වල පිටපත් විත්තිකරුවන්ට ලියාපදිංචි තැපෑල් මගින් හිතුත් කිරීම, දීසා අධිකරණයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනයට යොමුකිරීම සහ අදාල ඉඩමේ හොඳින් පෙනෙන ස්ථාන 10 ක අලවා ප්‍රසිද්ධ කිරීමට අධිකරණය මගින් අදාල පිස්කල්වරයා වෙත නියෝග කරනු ලබයි. මෙසේ සිදුකර දින 14 කින් පසුව මෙම ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු සිදුකරනු ලැබේ. මෙහිදී මෙම ඉඩම ඉඩම් තක්සේරුකරුවකු ලවා තක්සේරු කර තක්සේරු වටිනාකමට මෙම ඉඩමේ වෙන්දේසිය සිදුකරනු ලබන අතර පැමිණිලිකරුවෙත අයවිය යුතු මුදල ලබාදීමෙන් අනතුරුව ඉතිරි මුදල් විත්තිකරුවෙත ලබාදීම සිදුකරයි. මෙම ඉඩම වෙන්දේසිය සිදුකිරීමෙන් පසු එහි අයිතිය නීතිඥවරයෙකු මාර්ගයෙන් හෝ රෙජිස්ට්‍රාර්වරයා මාර්ගයෙන් වෙන්දේසි ඔප්පුවක් මගින් පවරනු ලැබේ.

ඉහතින් සඳහන් කළ ආකාරයට නිශ්චල දේපල හා චංචල දේපල තහනමට ගැනීමට අමතරව විත්තිකරුවන්ගේ වැටුප් තහනමකට ලක් කිරීම සිදුකළ හැකිය. මෙම ක්‍රමය රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයින්ට මෙන්ම පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු පුද්ගලයින්ගේද සිදුකළ හැකිය.

මෙම ක්‍රම 2 ක මගින් වඩාත් ප්‍රායෝගික යැයි මා සිතනු ලබන්නේ රාජ්‍ය සේවයේ නියුතු විත්තිකරුවන්ගේ වැටුප් තහනමකට ලක් කිරීමයි. මක් නිසාද පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පුද්ගලයින් රැකියාව හැරයාමේ ප්‍රවනතාවය ඉහල නිසාවෙනි. මෙහිදී මෙම විත්තිකරුවන් නිශ්චිතව රැකියාව සිදුකරන ස්ථානය කුමන දෙපාර්තමේන්තුවකද යන වග සහ ජාතික හැඳුනුම්පත් අංකය සහ එම පුද්ගලයාට අදාලව වැටුප සකස් කරන ස්ථානයේ ප්‍රධානියාගේ තනතුර සමග ලිපිනය නිරවුල්ව අධිකරණය වෙත අප විසින් අදාල ලේඛණ සමග ඉදිරිපත් කල යුතුය.

ඉන් අනතුරුව අදාල පුද්ගලයාගේ වැටුපෙන් රු.500/- ක් පමණක් ඉතිරිවන පරිදි අනෙකුත් සෑම දීමනාවක්ම තහනම් කරනු ලබන අතර ඉතිරි සෑම මුදලක්ම මාසිකව අදාල අධිකරණයේ නඩු අංකය හමින් වෙක්පතකින් එවන මෙන් අදාල ආයතන ප්‍රධානියාට නියෝගයක් යැවීම සිදුකරයි. මෙහිදී මූලිකව ආයතන ප්‍රධානියා විසින් විත්තිකරුට අදාල වැටුප් වාර්තාවක් අධිකරණය වෙත එවනු ලබන අතර ඉන්පසුව අදාල මුදල අයකරගැනීම සම්බන්ධව එම මුදල වැටුප් ලබනා මාස කොපමනකින් ගෙවා සම්පූර්ණවේද යන්න කෙටුම්පතක් සකස් කර එම ආයතන ප්‍රධානියා වෙත යොමුකරනු ලබයි.

ඉන් අනතුරුව මෙම මුදල් අධිකරණයේ නඩු අංකයට අදාල වෙක්පතකින් එවීම සිදුකරයි. මෙම වැටුප් තහනම ක්‍රියාත්මක කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් මෙම නියෝගය හිතුත් කිරීම හෝ විත්තිකරුව වැටුප ගෙවනු ලබන ස්ථානයට අදාල දීසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මාර්ගයෙන් එම නියෝගය හිතුත් කිරීමෙනි.

සටහන - සුපුන් මධුසංඛ
අධිකරණ විධායක නිලධාරී
ප්‍රධාන කාර්යාලය

මෙහෙවර සත්කාර

ඔබට රෝගී බවක් දැනේ නම් නොකඩවා වැඩෙහි යෙදෙන්න.

HNB ෆිනෑන්ස් මැදවච්චිය රන් ණය සේවා ඒකකය විවෘත කෙරේ

වසර 19ක් පුරා ශ්‍රී ලාංකීය පාරිභෝගික ජනතාව වෙත නම්‍යශීලී මූල්‍ය සේවාවන් රැසක් තිළිණ කළ HNB ෆිනෑන්ස් සමාගම දිවයින පුරා සිය රන් ණය සේවාව පුළුල් කිරීමේ පියවර යටතේ HNB ෆිනෑන්ස් මැදවච්චිය ශාඛාවෙහි රන් ණය ඒකකය පසුගියදා විවෘත කරන ලදි.

HNB ෆිනෑන්ස් මැදවච්චිය ශාඛාවෙහි අභිනවයෙන් ඇරඹී මෙම රන් ණය ඒකකය සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා විවෘත කෙරුණි. මෙම අවස්ථාවට HNB ෆිනෑන්ස් හි අධ්‍යක්ෂිත ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය හා නිලධාරීන් ඇතුළුව ගනුදෙනුකාර භවතුන් විශාල පිරිසක් එක් වූහ.

ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් මෙම අවස්ථාවට සහභාගී වූ HNB ෆිනෑන්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා අදහස් දක්වමින් ''කෘෂි කර්මාන්තය මූලික කරගත් මැදවච්චිය යුද්ධයෙන් අනතුරුව ශීඝ්‍ර සංවර්ධනයකට යොමු වී තිබෙනවා. මෙහි බොහෝ දෙනා කෘෂි ආර්ථිකය මත යැපෙන බැවින් ඒ ආශ්‍රිත ක්ෂණික මුදල් අවශ්‍යතා ඇති විය හැකියි. එබඳු පාරිභෝගිකයින් අරමුණු කර ආරක්ෂිත හා වටිනාකමට සරිලන මුදලක් ලබා දීම HNB ෆිනෑන්ස් ලෙස අපගේ වගකීම බව මම විශ්වාස කරනවා. දශක 2කට ආසන්න කාලයක් පුරා HNB ෆිනෑන්ස් සමාගම අතිශය සුහද සම්බන්ධතාවක් මැදවච්චිය ජනතාව සමග පවත්වා ඇති බැවින් HNB ෆිනෑන්ස් මැදවච්චිය රන් ණය මධ්‍යස්ථානය පාරිභෝගිකයින්ට වඩාත් සුදුසු ස්ථානයක් වනු ඇති බව මගේ අදහසයි'' යනුවෙන් පැවසීය.

"මෙහෙවර" සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

HNB ෆයිනෑන්ස් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අපවෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් රෝගාතුර පිළිසරණ අවශ්‍යතයින් කිහිපදෙනෙකුට පසුගියදා අපි ආධාර මුදල් ලෙස ලබාදීමට කටයුතු කළෙමු. එසේ මේ වනවිටත් ආධාර ලබාදී ඇති ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.

HNB FINANCE
මෙහෙවර
MEHEWARA

සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

ගම්පහ ශාඛාව
සාමාජිකාව - ජී. ඒ. ජී. පේරේරා
ආධාර ලාභියා - එම්.එච් සරුණාරත්න (පුතා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

මතුගම ශාඛාව
සාමාජිකාව - එම්. ප්‍රේමවතී
ආධාර ලාභියා - G.D. සුරාජ් (පුතා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

මොනරාගල ශාඛාව
සාමාජිකාව - ඒ. එස්. එන්. හෙට්ටිගේ
ආධාර ලාභියා - එම්. දිමිශාන් (පුතා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

හාවලපිටිය ශාඛාව
සාමාජිකාව - ඩී. ජී.සිද්ධිකා හේරත්
ආධාර ලාභියා - තනුජ සසඟන් (පුතා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

කැකිරාව ශාඛාව
සාමාජිකාව - ඩී.එම්. ශ්‍රීමාලි දිසානායක
ආධාර ලාභියා - කේ.එම්.ජී.ඩී. සන්තන්තර (පුත්‍රා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

හාවලපිටිය ශාඛාව
සාමාජිකාව - එච්.කේ.ස්වර්ණලතා
ආධාර ලාභියා - කේ.එස්. සතුල්ගා (පුත්‍රා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

බදුල්ල ශාඛාව
සාමාජිකාව - ඩී.එම්.ජී.එන්. දිසානායක
ආධාර ලාභියා - ඒ.එම්.ඩී. සමන් (පුතා)
ආධාර ලබාදීමට හේතුව - වෛද්‍ය ප්‍රතිකාර සඳහා

HNB FINANCE
මෙහෙවර

මෙහෙවර පැණසර

ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්

ප්‍රහේලිකා අංක 16

දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි

යමෙකු යෝධයෙකු වන්නේ අවට අය කුඩාවන තරමටය.



හරහට

1. ලෝ පතල KFC ව්‍යාපාරයේ නිර්මාතෘවරයා මොහුය.
2. කපිරිඤ්ඤා වලින් බිඳී ආ ගායනා විශේෂයකි.
4. ජී. බී. සේනානායකයන් විසින් රචිත ප්‍රකට නවකතාවකි.
7. අතීතයේදී යාපාපටුන නමින් හැඳුන්වුණු මෙම ප්‍රදේශය අද හැඳින්වෙනුයේ මේ නමිනි.
10. වෘත්තයක මධ්‍ය ලක්ෂයේ සිට පරිධියට ඇති දුර හැඳින්වෙනුයේ..... නමිනි
11. අප්‍රිකානු සමිතියකින් යුත් කාපිරි ජන කොටසක් පුත්තලමට නුදුරුව ඇති මෙම ගම්මානයේ අදටත් වාසය කරති.

පහලට

1. ශබ්දය මනිනු ලබන ඒකකය මෙනම්
3. දුක යන්නට විරුද්ධ අරුත් දෙන පදයකි.
5. විජය රජු ලංකාවට පැමිණියේ මෙහි සිට යැයි පුරාවෘත්ත වල කියවේ
6. පෙර රජ දවස කුමාරිකාවකට තම අභිමත සහකරුවා තෝරා ගැනීම සඳහා ලබාදුන් අවස්ථාව හඳුන්වන්නේ මෙනමිනි
7. එක පැත්තකට බාන ලද එක පලයකින් පමණක් සමන්විත වහලය සහිත නිවස හඳුන්වන රජරට ජන වහරේ එන වදනකි.
8. "නොපෙනෙන" යන අරුත් දේ
9. පාරම්පරිකව රෙදි සේදීම රැකියාව කරගත්තවුන් හැඳින්වීම සඳහා මේ නමද භාවිතා වේ.

නම : ..... සේවක අංකය : .....
ශාඛාව : ..... ප්‍රහේලිකාව පිරවුයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම : .....
සම්පූර්ණ සම්බන්ධය : .....
දිනය : ..... අත්සන : .....

මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 16

මේ අයත් නිවැරදි විසඳුම් එවා තිබුණා

ඩබ්ලිව්. ඩී. කේ. ජී. වීරසිංහ - බලංගොඩ ශාඛාව, ඉසුරු චාමින්ද - රත්නපුර ශාඛාව ජිවන්ත දෙරුවන් - බණ්ඩාරගම ශාඛාව, දසුනි හපුආරච්චි - ප්‍රධාන කාර්යාලය, එච් ආර් ඩී ආර් බණ්ඩාර - කෑගල්ල ශාඛාව, රජිත උමේෂ්, එම් එස් එන් මල්වාලගේ - රත්නපුර ශාඛාව, කේ සි ජී කුමාර - රත්නපුර ශාඛාව, සුරංග අබේවික්‍රම - ප්‍රධාන කාර්යාලය, ශානක - ප්‍රධාන කාර්යාලය ඕෂාන් පෙරේරා - ප්‍රධාන කාර්යාලය එම් වී පී අයේශා ප්‍රධාන කාර්යාලය ඒ පී පී කේ ආර් අමරසිංහ රත්නපුර ශාඛාව, ප්‍රියන්තිකානී - ප්‍රධාන කාර්යාලය, උදාරි ධර්මවර්ධන - ප්‍රධාන කාර්යාලය, ජී අයි ඊ මිජිත - රත්නපුර ශාඛාව, ක්‍රිශාන්ත් ප්‍රධාන කාර්යාලය, ඩිශාන් ඇන්ඩෘ - ප්‍රධාන කාර්යාලය, ඔකද ජයසිංහ - ප්‍රධාන කාර්යාලය, එන් එස් වී.පෙරේරා - ප්‍රධාන කාර්යාලය, ශානක ප්‍රනාන්දු - ප්‍රධාන කාර්යාලය, එම් ඩී දේශාන් - රත්නපුර ශාඛාව, අසේල ඒකනායක නුවර ශාඛාව, එච්.ඩී සමින්ද නුවර ශාඛාව, ජී ආර් සලිත, අයි එල් යූ පියශාන්ත - රත්නපුර ශාඛාව, භාතිය අමරසේකර - ප්‍රධාන කාර්යාලය, ඉසුරු ලක්ෂාන් - රත්නපුර ශාඛාව, හසිත ගමිගේ - ප්‍රධාන කාර්යාලය, කේ ඒ ශමිල - රත්නපුර ශාඛාව, ඉංදික අසේල - මහනුවර ශාඛාව, නිශාන්ත ප්‍රදීප් - ප්‍රධාන කාර්යාලය ජේ පලිහක්කාර - නුවර ශාඛාව, ආර් එම් වසන්ත - හම්බන්තොට ශාඛාව, සඳලි ගුණසේකර - ප්‍රධාන කාර්යාලය ඒ.එස්. අබේසිරිවර්ධන - හම්බන්තොට ශාඛාව, සුදත් විජේන්ද්‍ර - ප්‍රධාන කාර්යාලය මධුෂා ගයානි - ප්‍රධාන කාර්යාලය, එච්.ඩී.සමින්ද, ඩබ්. ක්‍රිශාන් - ප්‍රධාන කාර්යාලය, බී. චතුරිකා - ප්‍රධාන කාර්යාලය, එල්. හේවගේ - ප්‍රධාන කාර්යාලය,

මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 15 මාර්තු - අප්‍රේල් කලාපයේ ජයග්‍රාහකයෝ

ඒ.එස්. අබේසිරිවර්ධන
හම්බන්තොට ශාඛාව

ඉංදික අසේල
නුවර ශාඛාව

ජීවන්ත සඳරුවන්
බණ්ඩාරගම

සදීපා

• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

Sole Agent in Sri Lanka
PELANGI
Penerbitan Sdn. Bhd.
Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS(PVT)LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

Atlas සිත්තර යාළු පුංචි අපේ චිත්‍ර පිටුව

HNB FINANCE මෙහෙවර

දැනුම මතම නව දැනුම වර්ධනය වේ.

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ෆිනෑන්ස් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා තෑග කට්ටල තුනක් පිරිනමනු ලබන අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ෆිනෑන්ස් ලිමිටඩ්, අංක 168, නාවල පාර , නුගේගොඩ, යන ලිපිනයට නොපමාව යොමු කරන්න.

කුරුළු කූඩුව
කේ.ජී. සෙනුල රන්සන
2 ශ්‍රේණිය
කේ.ඒ.එන්.පී.කේ. ජයවර්ධන (ගම්පහ ශාඛාව)

බෙන් ටෙන්
එච්.ජී.ඉරුෂ හිමිහාන අබේගුණවර්ධන
7 ශ්‍රේණිය
එච්.ජී.කපිල අබේගුණවර්ධන (කෑගල්ල ශාඛාව)

අලි පවුල
නිදුක දෙනෙත් සේනාරත්න
4 ශ්‍රේණිය
කසුන් උපේන්ද්‍ර සේනාරත්න (නිට්ටඹුව ශාඛාව)

වනාන්තරය
සිතුමිණ මෙන්ඩිස්
8 වසර
සුනන්ද මෙන්ඩිස් (ප්‍රධාන කාර්යාලය)

මගේ නංගි
සයුරි අමාෂා දිව්‍යාංජලී
6 ශ්‍රේණිය
නිශාන්ත ප්‍රදීප් කුමාර (ප්‍රධාන කාර්යාලය)

දිය ඇල්ල
සදුප හසරැල් රණවීර
5 ශ්‍රේණිය
කමල් ප්‍රියංග (ප්‍රධාන කාර්යාලය)

ගොවි බිමක්
හිමංසී ස්විනා ආශිංසනී ප්‍රනාන්දු
2 ශ්‍රේණිය
දමිත් සංජීව (මතුගම ශාඛාව)

Atlas සිත්තර යාළු

මාර්තු - අප්‍රේල් කලාපයේ ජයග්‍රාහකයෝ

- නිමිදිරිය
  උතුල් බුද්ධිමා තන්ත්‍රිගේ
  4 වසර (බුද්ධික තන්ත්‍රිගේ - ප්‍රධාන කාර්යාලය)

- දිය කිඳුරු කුමාරියක්
  පෙත්මි රනුල්යා මුදලිගේ
  1 ශ්‍රේණිය (උදය ඉංදික මුදලිගේ - හොරණ ශාඛාව)

- මගේ මල් පාත්තිය
  ආර්.ඒ.සතුදි සහන්සා
  පුබුදු පෙර පාසැල (හර්ෂ රණවීර වැලිමඩ ශාඛාව)

පසුගිය මාසයන්හි මෙහෙවර සිත්තර යාළු වෙත චිත්‍ර ඇඳ එවා තිලිණ දිනූ වාසනාවන්ත දූ පුතුන් අතරින් ජහත සඳහන් දූ පුතුන් නම ත්‍යාගය සමග ලබාගත් ඡායාරූප අප වෙත එවා තිබුණා.ජයග්‍රහනය ලද ඔබ සියළුම දෙනාට අපගේ සෙනෙහසේ සුබ පැතුම්..

දිනිති ඉමේෂා අබේසේකර

ලිවිනි ඔකිත්මා මුගුණමල්වත්ත



මේධාවි ආදිත්‍යා හේරත්

ජයග්‍රහණයේ මාවත වැටී ඇත්තේ පරාජයන් ඔස්සේය.

සියළුම මූල්‍ය සේවා සමගින් HNB ෆිනෑන්ස් මාතර ශාඛාව නව නිවහනකට

වසර 19ක් පුරා ශ්‍රී ලාංකීය පාරිභෝගික ජනතාව වෙත හමුවශීලී මූල්‍ය සේවාවන් නිළිණ කළ HNB ෆිනෑන්ස් සමාගම සිය මාතර ශාඛාව වඩාත් ඉඩ පහසුකම් සපිරි නව ගොඩනැගිල්ලකට ගෙන යන ලද අතර එහි රන් ණය ඒකකය ද එදිනම විවෘත කරන ලදී.

අංක 366/2/1, අනගාරික ධර්මපාල මාවත, පමුරන, මාතර යන ලිපිනයෙහි පිහිටා ඇති අහිනව HNB ෆිනෑන්ස් මාතර ශාඛාව සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ චමින්ද ප්‍රභාත් මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරුණ අතර මෙම අවස්ථාවට HNB ෆිනෑන්ස් හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඇනස්ලි ප්‍රනාන්දු, සහකාර සාමාන්‍යාධිකාරිවරුන් වන කමල් ප්‍රියංග, ප්‍රභාත් කනුනාරච්චි ප්‍රාදේශීය කළමනාකරු වන වසන්ත සිරිවර්ධන යන නිලධාරී මහතුන් ඇතුළුව විශාල පිරිසක් එක් වූහ.

HNB ෆිනෑන්ස් සමාගම මගින් සපයන්නාවූ

සියළුම මූල්‍ය සේවාවන් මාතර ශාඛාවෙන් සපයනු ලබන අතර HNB ෆිනෑන්ස් රන් ණය සේවාව එම මූල්‍ය සේවාවන් අතරට අහිනවයෙන් එක්වූ මූල්‍ය සේවාව බවත් මෙතැන් සිට එම රන් ණය සේවාවද වඩාත් වැඩි විශ්වාසයකින් හා තහවුරු කරන ලද සුරක්ෂිතතාවකින් යුතුව තම ශාඛාවෙන් ලබාගැනීමේ හැකියාව පාරිභෝගිකයන් වෙත ලැබෙන බවත් මාතර ශාඛාවේ කළමනාකරු වන

එස්.ඒ. සුදත් වීරසිංහ මහතා මෙහෙවරට පැවසීය.

HNB FINANCE
මෙහෙවර

එච් එන් බී ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbfinance.lk
වෙබ් :- www.hnbfinance.com

අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- ප්‍රසාද් නෙරංජන්
මුද්‍රණය :- අර්ජුන ග්‍රැෆික්ස්, රත්නපිටිය.
ඡායාරූප ශිල්පි :- ලක්ෂමන් කුමාරතුංග

පාරිභෝගිකයන්ට සුවිශේෂී අත්දැකීම් ලබා දෙමින් HNB ෆිනෑන්ස් නවතම ආයතනික වෙබ් අඩවිය දියත් කරයි.

නව අංග රැසකින් සහ පරිශීලක පහසුව සහිත අපගේ නවතම වෙබ් අඩවිය වන www.hnbfinance.lk පසුගිය ජූනි 12 දා HNB ෆිනෑන්ස් ග්‍රවනාගාරයේදී එළි දක්වන ලදී.

මෙ පිළිබඳව අදහස් දක්වන HNB ෆිනෑන්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා, "අපගේ නව වෙබ් අඩවිය විශාල පරිශීලක පිරිසකට ග්‍රහණය කර ගත හැකි පරිදි සිංහල දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම සකසා තිබෙනවා. ඒවගේම පාරිභෝගිකයන්ට තම මූල්‍ය ඉලක්ක සැලසුම් කරගැනීමට පහසු වන පරිදි ණය, ලීසිං, සහ ස්ථාවර තැන්පතු ගණනය කළ හැකි අතුරු මුහුණතක්ද (Inter face) වෙබ් අඩවිය තුළ අන්තර්ගත වනවා. තවද අයදුම් පත්‍ර බාගත කිරීමේ හැකියාව, සවිස්තරාත්මක පිටු, call back buttons, යනාදිය මෙම වෙබ් අඩවියේ ඇති අනෙකුත් විශේෂාංග ලෙස හඳුන්වා දෙන්න පුළුවන්.

"මෙම නව වෙබ් අඩවිය අපගේ ඒකාබද්ධ ඩිජිටල් අලෙවිකරණ උපාය මාර්ගයේ ප්‍රධාන අංගයක් වන අතර ඩිජිටල් අවකාශයේ ආයතනික නව මුහුණුවර ලෙසද ක්‍රියා කරනු ලබනවා. එමෙන්ම වසර ගණනාවක් පුරා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීමට අප ගත් උත්සාහයේ පැහැදිලි සළකුණක් ලෙසද මෙය සැළකිය හැකියි යනුවෙන් ඔහු වැඩිදුරටත් සඳහන් කර සිටියි.

ඔහුම ඩිජිටල් උපාංගයක් මත ක්‍රියාකළ හැකි පරිදි නිර්මාණය කර ඇති www.hnbfinance.lk වෙබ් අඩවිය ඩෙස්ක්ටොප් පරිගණක සහ ජංගම දුරකථන තිරයන් මත බාධාවකින් තොරව ක්‍රියා කරනු ලබයි. එසේම නිර්මාණශීලී ලෙස සහ අනාගත තාක්ෂණයට ගැලපෙන ලෙස නිර්මාණය කර ඇති නිසා පරිශීලකයන්ට ඉතා පහසුවෙන් තමන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ හැකියාව පවතී. තවද ජංගම තිරය මත ඇති call button පහසුකම නිසා HNB ෆිනෑන්ස් හා සාජුවම සම්බන්ධ වීමේ පහසුකමද මෙහි ඇති විශේෂත්වය වේ.

මීට අතිරේකව HNB ෆිනෑන්ස් සමාගමේ පුවත්, කාර්යමණ්ඩලයේ තොරතුරු, ඔවුන්ගේ කුසලතා හා ජයග්‍රහන පිළිබඳ තොරතුරු ඇතුලත් "මෙහෙවර" ඊ පුවත්පත වෙත පිවිසීමේ හැකියාවද ඇත. එසේම HNB ෆිනෑන්ස් සමග එක්වී වාර්ෂික ජීවිතය ජයගැනීමට කැමති පිරිස් හට වෙබ් අඩවියේ රැකියා අවස්ථා කොටස වෙත පිවිසීමෙන් ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමේ හැකියාව පවතී.